(හයවැනි පාර්ලිමේන්තුව — තෙවැනි සභාවාරය)

අංක. 2(6)]

# පාර්ලිමේන්තුවේ අංක 2 දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2008 දෙසැම්බර් මස 19 වැනි සිකුරාදා**

**2009 ජනවාරි මස 06 වැනි අඟහරුවාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0752/'08

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා,— ජාතිය ගොඩනැඟීමේ සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ගම්පහ දිස්ත්‍රික්කයේ එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ 2004 වර්ෂයේ සිට 2007 වර්ෂය දක්වා සෑම වර්ෂයකම ජූනි මස 30 වැනි දිනට හිමිකම් ලබමින් සිටින සමෘද්ධිලාභීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එසේ හිමිකම් ලද අයට ගෙවන ලද මුදල් ප්‍රමාණයන්, ඔවුන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iii) 2004, 2005, 2006 සහ 2007 වර්ෂවල සමෘද්ධිලාභීන්ට ගෙවන ලද මුදල් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත වර්ෂ තුළ සමෘද්ධිලාභීන් වශයෙන් සිටි එහෙත් පසුව ඉන් ඉවත් කරන ලද සංඛ්‍යාව සහ එම අයගේ නම් සහ ලිපිනයන් කවරේද;

(ii) එසේ ඉවත් කරන ලද්දේ කවර පදනමක් යටතේද;

(iii) අලුතින් එක් වූ සමෘද්ධිලාභීන් සිටීනම් එම අයට ගෙවූ මුදල් ප්‍රමාණය සහ ඔවුන්ගේ ලිපිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0888/'08

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) මීගොඩ, ගොඩගම, පැල්පොල වත්තේ, සමාධි මාවත හා කිරිමැට්ට පාර යන ස්ථාන දෙකෙහි ඇතිවී තිබෙන අනතුරු හේතුවෙන් දුම්රිය ආරක්ෂිත ගේට්ටුවක හෝ විදුලි සංඥා ලාම්පුවක අවශ්‍යතාවය හෝමාගම ප්‍රාදේශීය සභාව හා ප්‍රදේශවාසීන් විසින් ලිඛිතව දන්වා ඇති බවත්;

(ii) පිළිතුරු වශයෙන් 2008.04.30 දිනැති ලිපියක් එතුමාටද පිටපතක් සහිතව දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් හෝමාගම ප්‍රාදේශීය සභාවේ සභාපති වෙත එවා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) දුම්රිය මාර්ගය හරහා ඇති හරස් මාර්ගවල ගමන් ගන්නා මගීන්ගේ ආරක්ෂාව සැපයීමට දුම්රිය දෙපාර්තමේන්තුවට කිසිදු අවශ්‍යතාවයක් නොමැති බවට එම ලිපියේ 2 වැනි ඡේදයේ සඳහන් බවටත්;

(ii) 3 වැනි ඡේදයේ, හරස් මාර්ග ඔස්සේ ගමන් ගන්නා වාහන ධාවකයන්ට ආරක්ෂාව සැපයීමට දුම්රිය දෙපාර්තමේන්තුවට වගකීමක් නැති බවටත්;

(iii) 4 වැනි ඡේදයේ, දුම්රිය දෙපාර්තමේන්තුව විසින් ඒ සඳහා ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන ඇති බවටත්;

සඳහන් කර ඇති බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) දුම්රිය සාමාන්‍යාධිකාරිවරයාගේ ලිපියේ සඳහන් පරිදි හරස් මාර්ගවල ගමන් ගන්නා මගීන්ගේ හා වාහනවල ආරක්ෂාව ගැන නොසැලකීමට ප්‍රතිපත්තිමය තීරණය ගන්නා ලද්දේ කවදාද;

(ii) තීරණය ගැනීමට සහභාගි වූ අය කවුරුන්ද;

(iii) එම තීරණය පොදු මහජනතාවට දැනුම් දීමට පියවර ගෙන තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0773/’08

ගරු එම්. ඩී. නාමල් කරුණාරත්න මහතා,— පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) කුරුණෑගල හා මාතලේ දිස්ත්‍රික්ක මායිම් දෙපස පිහිටා ඇති ‘‘හල්මිල්ල දෙමඩ’’ රක්ෂිතයට අයත් මාතලේ දිස්ත්‍රික්කයේ 431/ඒ, ගොම්බාව ග්‍රාම නිලධාරි වසමේ හා කුරුණෑගල දිස්ත්‍රික්කයේ 411 ඉම්හාමින්නේගම ග්‍රාම නිලධාරි වසමේ දිස්ත්‍රික් මායිම් දෙපස පිහිටි රක්ෂිතයේ කොටස් නිරූපණයේදී, ඉම්හාමින්නේගම ග්‍රාම නිලධාරි වසමේ පුද්ගලික (සින්නක්කර) ඉඩම් පවා රක්ෂිතය තුළට ගෙන නිරූපණය කර ඇතත්, ‘‘හල්මිල්ල දෙමඩ’’ රක්ෂිතයේ පී. ඩී. කාන්ති මීගොඩ යන අය භුක්තිවිඳින ඉඩම රක්ෂිතයට ඇතුළත් නොවන සේ නිරූපණය කර ඇති බවත්;

(ii) ඉම්හාමින්නේගම ‘‘පුබුදු’’ ග්‍රාම සංවර්ධන සමිතියට ග්‍රාමීය කර්මාන්ත හා ස්වයංරැකියා ප්‍රවර්ධන අමාත්‍යාංශයෙන් ප්‍රජා ජල ව්‍යාපෘතියක් සඳහා රු. 1,048,044.00ක මුදලක් ලැබී තිබුනද, ඒ සඳහා ‘‘හල්මිල්ල දෙමඩ’’ ඇල ආශ්‍රිත භූමියට යාමට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය වන සංරක්ෂකගේ ‘‘වාර්ෂික විවිධ අවසර පත්‍රයක්’’ ලබාගෙන තිබියදීත් පෙර භුක්තිකාරිය ඊට බාධා කරන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත භුක්තිකාරිය හා ඇගේ සහායකයින් විසින් ඇතිකරන බාධාවන් ඉවත් කිරීමට පියවර ගන්නේද;

(ii) රක්ෂිතය නිරූපණයේදී සිදුවූ ඌණතා මඟහරිමින් නැවත රක්ෂිතය සලකුණු කිරීමට කටයුතු කරන්නේද;

(iii) රක්ෂිතය විනාශ කරමින් එය තම ග්‍රහනයට ගැනීමට කටයුතු කළ අයට එරෙහිව නීත්‍යානුකූල පියවර ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0600/'08

ගරු වයි. එම්. නවරත්න බණ්ඩා මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව මගින් 2007 වසරේ නිකුත්කළ සිංහල සාහිත්‍ය සංග්‍රහය 10, 11 වසර සඳහා නිර්දේශිත පෙළපොතේ ඇතුළත් කුඩලිගම කවියාගේ "වැස්ස" නම් කවි පෙළේ පළමු කවිය ඉවත් කරන ලද්දේ කවර හේතුවක් නිසාද;

(ii) එම ග්‍රන්ථයේම අරිසෙන් අහුබුදු ශූරීන්ගේ මගුල් ගීය නම් කවිපෙළක් උපුටා දක්වතත් එහි කවියාගේ නම සඳහන් නොකිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත ග්‍රන්ථයේ ඇතැම් කවිවල අර්ථ විකෘතිකර ඇති බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) මෙවැනි අධ්‍යාපන පෙළපොත් වල සිදුවී ඇති වැරදි නිවැරදි කිරීමට පියවර ගන්නේද;

(ii) එම වැරදිවලට වගකිවයුත්තන් හඳුනාගෙන තිබේද;

(iii) එසේ නම්, ඒ කවුරුන්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0863/'08

ගරු ජේමසිරි මානගේ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) පාසල් පද්ධතිය තුළ ධීවර විෂය හදාරන ශිෂ්‍යයින් සිටින බව එතුමා දන්නෙහිද?

(ආ) (i) පාසල් පද්ධතිය තුළ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ධීවර විෂය හදාරන ශිෂ්‍ය සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම විෂය ක්‍රියාත්මක වන පාසල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) 2008 වර්ෂය සඳහා ධීවර විෂයට අදාළව සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවෙන් මුද්‍රිත පෙළපොත් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ සඳහා වැය කළ මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0866/'08

ගරු ජේමසිරි මානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) කච්චතිව් දූපතේ විශාලත්වය කොපමණද;

(ii) එම දූපතේ සම්පූර්ණ ජනගහනය කොපමණද;

(iii) එහි ධීවරයින් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉන්දීය රජයට එම දූපතේ අයිතිය නොමැති බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) එම දූපත සම්බන්ධයෙන් ඉන්දීය රජය විසින් ශ්‍රී ලංකාවේ රජයට කරන ලද බලපෑම් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0590/'08

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) අනුරාධපුර රෝහල පිටුපස පිහිටි පොන්නාරායන් කුලම් වැව අවට රජයට අයත් භූමි භාගය අනවසරයෙන් හා බලහත්කාරයෙන් කිසියම් පිරිසක් විසින් අත්පත් කර ගෙන ඇතිබව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම අනවසරයෙන් අත්පත් කරගත් කොටස රජරට විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ කටයුතු සඳහා යෝජිත කොටසක් ලෙස පැවතියේද;

(ii) මෙම අනවසර, බලහත්කාරී අත්පත් කර ගැනීමට එරෙහිව ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0604/'08

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) දැයට කිරුළ 2008 ප්‍රදර්ශනය වෙනුවෙන් පළාත් සභාවලට අයත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ආයතන සහභාගී වූයේද;

(ii) පළාත් සභා සහභාගීවූයේ නම්, එක් එක් පළාත් සභාව වෙන් වෙන් වශයෙන් කවර කටයුතුවල නිරතවීද;

(iii) එකී පළාත් සභා මගින් ප්‍රදර්ශන කුටි හෝ ප්‍රදර්ශන උපකරණ සපයන ලද්දේද;

(iv) එසේ නම්, එම එක් එක් පළාත් සභාව වෙන වෙනම කවර ප්‍රදර්ශන කාර්යයක නිරතවීද;

(v) එක් එක් පළාත් සභාවේ අමාත්‍යාංශ හෝ ආයතන මගින් ඉදිරිපත් කරන ලද ප්‍රදර්ශන කුටි සහ වැය කළ මුදල කොපමණද;

(vi) එම මුදල් වැය කරන ලද ආයතන හා අදාළ වැය ශීර්ෂය කවරේද;

(vii) සියලුම පළාත් සභා මගින් එම ප්‍රදර්ශනය සඳහා වැය කරන ලද මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0779/'08

ගරු තිලකරත්න විතානාච්චි මහතා,— කර්මාන්ත සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) බද්දේගම ගිණිමැල්ලගහ පිහිටි "වාන්ට් ලංකා කන්පැක්ෂනරීස්" ආයතනය දේශීය කර්මාන්ත ශාලාවක් ලෙස විශාල පිරිසකට රැකියා ලබාදෙමින් පවත්වාගෙන යන බවත්;

(ii) තෙකලා විදුලිබලය නොමැති නිසා එම කර්මාන්ත ශාලාවේ ධාරිතාව වැඩි කිරීමට නොහැකි වී ඇති බවත්;

(iii) තෙකලා විදුලිබලය ලබාදෙන ලෙස ලංකා විදුලිබල මණ්ඩලයෙන් ඉල්ලා සිටියද, මීටර් ගණනාවක දුරෙහි වෙනසක් නිසා මෙතෙක් විදුලිය ලබා දී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මේ නිසා නව විදුලි ට්‍රාන්ස්ෆෝමරයක් සවිකර විදුලිය ලබා ගැනීමට සිදුවී ඇති බව අදාළ අමාත්‍යාංශයට වාර්තා වී තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) පවතින නිෂ්පාදන වියදම් අධිකවීම නිසා එවැනි විශාල මුදලක් එකවර ආයෝජනය කිරීමට නොහැකි බවත්;

(ii) දේශීය කර්මාන්ත සංවර්ධනය කිරීමේ මහින්ද චින්තන වැඩ පිළිවෙළ යටතේ මෙම කර්මාන්ත ශාලාවට විදුලිය උප පොළක් ලබාදෙන්නේ නම් තවත් විශාල පිරිසකට රැකියා ලබාදීමට හැකි බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඈ) මෙම තත්වය සැලකිල්ලට ගෙන දේශීය කර්මාන්ත රැක ගැනීමේ සහ වැඩි දියුණු කිරීමේ වැඩ පිළිවෙළ යටතේ නව විදුලි උප පොළක් පිහිටුවීමට වැය වන මුදලින් කොටසක් හෝ ලබාදීමට ඇති හැකියාව සොයා බලා කටයුතු කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

**(2009 ජනවාරි මස 06 වැනි අඟහරුවාදා)**

0234/'08

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— තරුණ කටයුතු අමාත්‍යතුමියගෙන් ඇසීමට,—

(අ) (i) තරුණ කටයුතු (කැබිනට්) අමාත්‍යතුමිය සඳහා නිල නිවාසයක් ලබා දී තිබේද;

(ii) එසේ නම්, එය රජය සතු දේපලක්ද;

(iii) රජය සතු නොවේ නම් කවර පදනමක් යටතේ එය ලබා දී තිබේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නිල නිවසක් ලබා දී තිබේ නම්, එය 2005, 2006 සහ 2007 වර්ෂ තුළ අලුත්වැඩියා කර හෝ වැඩිදියුණු කර තිබේද;

(ii) අලුත්වැඩියා කළේ නම් ඉහත එක් එක් වර්ෂවල වැයකළ මුදල කොපමණද;

(iii) ඉහත නිවාසයේ ප්‍රයෝජනය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂ තුළ රජයේ වියදමින් ගෘහභාණ්ඩ හෝ වෙනත් උපකරණ මිලදී ගෙන තිබේද;

(iv) එසේ නම්, ඒ සඳහා වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමිය මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) මෙම නිල නිවාසය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂවල එක් එක් මාසය තුළ භාවිතා කර ඇති විදුලිය හා ජල ඒකක ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ සඳහා අදාළ අමාත්‍යාංශය මගින් ඉහත එක් එක් වර්ෂයේ සහ එක් එක් මාසය තුළ වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0236/'08

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) තැපැල් හා විදුලි සංදේශ (කැබිනට්) අමාත්‍යතුමා සඳහා නිල නිවාසයක් ලබා දී තිබේද;

(ii) එසේ නම්, එය රජය සතු දේපලක්ද;

(iii) රජය සතු නොවේ නම් කවර පදනමක් යටතේ එය ලබා දී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නිල නිවසක් ලබා දී තිබේ නම්, එය 2005, 2006 සහ 2007 වර්ෂ තුළ අලුත්වැඩියා කර හෝ වැඩිදියුණු කර තිබේද;

(ii) අලුත්වැඩියා කළේ නම් ඉහත එක් එක් වර්ෂවල වැයකළ මුදල කොපමණද;

(iii) ඉහත නිවාසයේ ප්‍රයෝජනය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂ තුළ රජයේ වියදමින් ගෘහභාණ්ඩ හෝ වෙනත් උපකරණ මිලදී ගෙන තිබේද;

(iv) එසේ නම්, ඒ සඳහා වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) මෙම නිල නිවාසය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂවල එක් එක් මාසය තුළ භාවිතා කර ඇති විදුලිය හා ජල ඒකක ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ සඳහා අදාළ අමාත්‍යාංශය මගින් ඉහත එක් එක් වර්ෂයේ සහ එක් එක් මාසය තුළ වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0267/'08

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— කර්මාන්ත සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) පේෂකර්මාන්ත සංවර්ධන (කැබිනට් නොවන) අමාත්‍යතුමා සඳහා නිල නිවාසයක් ලබා දී තිබේද;

(ii) එසේ නම්, එය රජය සතු දේපලක්ද;

(iii) රජය සතු නොවේ නම් කවර පදනමක් යටතේ එය ලබා දී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නිල නිවසක් ලබා දී තිබේ නම්, එය 2005, 2006 සහ 2007 වර්ෂ තුළ අලුත්වැඩියා කර හෝ වැඩිදියුණු කර තිබේද;

(ii) අලුත්වැඩියා කළේ නම් ඉහත එක් එක් වර්ෂවල වැයකළ මුදල කොපමණද;

(iii) ඉහත නිවාසයේ ප්‍රයෝජනය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂ තුළ රජයේ වියදමින් ගෘහභාණ්ඩ හෝ වෙනත් උපකරණ මිලදී ගෙන තිබේද;

(iv) එසේ නම්, ඒ සඳහා වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) මෙම නිල නිවාසය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂවල එක් එක් මාසය තුළ භාවිතා කර ඇති විදුලිය හා ජල ඒකක ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ සඳහා අදාළ අමාත්‍යාංශය මගින් ඉහත එක් එක් වර්ෂයේ සහ එක් එක් මාසය තුළ වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0269/'08

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) රාජ්‍ය ආදායම් හා මුදල් (කැබිනට් නොවන) අමාත්‍යතුමා සඳහා නිල නිවාසයක් ලබා දී තිබේද;

(ii) එසේ නම්, එය රජය සතු දේපලක්ද;

(iii) රජය සතු නොවේ නම් කවර පදනමක් යටතේ එය ලබා දී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නිල නිවසක් ලබා දී තිබේ නම්, එය 2005, 2006 සහ 2007 වර්ෂ තුළ අලුත්වැඩියා කර හෝ වැඩිදියුණු කර තිබේද;

(ii) අලුත්වැඩියා කළේ නම් ඉහත එක් එක් වර්ෂවල වැයකළ මුදල කොපමණද;

(iii) ඉහත නිවාසයේ ප්‍රයෝජනය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂ තුළ රජයේ වියදමින් ගෘහභාණ්ඩ හෝ වෙනත් උපකරණ මිලදී ගෙන තිබේද;

(iv) එසේ නම්, ඒ සඳහා වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) මෙම නිල නිවාසය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂවල එක් එක් මාසය තුළ භාවිතා කර ඇති විදුලිය හා ජල ඒකක ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ සඳහා අදාළ අමාත්‍යාංශය මගින් ඉහත එක් එක් වර්ෂයේ සහ එක් එක් මාසය තුළ වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0246/'08

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— නැවත පදිංචි කිරීමේ හා ආපදා සහන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ආපදා සහන සේවා (කැබිනට් නොවන) අමාත්‍යතුමා සඳහා නිල නිවාසයක් ලබා දී තිබේද;

(ii) එසේ නම්, එය රජය සතු දේපලක්ද;

(iii) රජය සතු නොවේ නම් කවර පදනමක් යටතේ එය ලබා දී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නිල නිවසක් ලබා දී තිබේ නම්, එය 2005, 2006 සහ 2007 වර්ෂ තුළ අලුත්වැඩියා කර හෝ වැඩිදියුණු කර තිබේද;

(ii) අලුත්වැඩියා කළේ නම් ඉහත එක් එක් වර්ෂවල වැයකළ මුදල කොපමණද;

(iii) ඉහත නිවාසයේ ප්‍රයෝජනය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂ තුළ රජයේ වියදමින් ගෘහභාණ්ඩ හෝ වෙනත් උපකරණ මිලදී ගෙන තිබේද;

(iv) එසේ නම්, ඒ සඳහා වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) මෙම නිල නිවාසය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂවල එක් එක් මාසය තුළ භාවිතා කර ඇති විදුලිය හා ජල ඒකක ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ සඳහා අදාළ අමාත්‍යාංශය මගින් ඉහත එක් එක් වර්ෂයේ සහ එක් එක් මාසය තුළ වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0250/'08

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) මහාමාර්ග (කැබිනට් නොවන) අමාත්‍යතුමා සඳහා නිල නිවාසයක් ලබා දී තිබේද;

(ii) එසේ නම්, එය රජය සතු දේපලක්ද;

(iii) රජය සතු නොවේ නම් කවර පදනමක් යටතේ එය ලබා දී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නිල නිවසක් ලබා දී තිබේ නම්, එය 2005, 2006 සහ 2007 වර්ෂ තුළ අලුත්වැඩියා කර හෝ වැඩිදියුණු කර තිබේද;

(ii) අලුත්වැඩියා කළේ නම් ඉහත එක් එක් වර්ෂවල වැයකළ මුදල කොපමණද;

(iii) ඉහත නිවාසයේ ප්‍රයෝජනය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂ තුළ රජයේ වියදමින් ගෘහභාණ්ඩ හෝ වෙනත් උපකරණ මිලදී ගෙන තිබේද;

(iv) එසේ නම්, ඒ සඳහා වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) මෙම නිල නිවාසය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂවල එක් එක් මාසය තුළ භාවිතා කර ඇති විදුලිය හා ජල ඒකක ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ සඳහා අදාළ අමාත්‍යාංශය මගින් ඉහත එක් එක් වර්ෂයේ සහ එක් එක් මාසය තුළ වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2009 ජනවාරි මස 07 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0494/'08

ගරු විජිත හේරත් මහතා,—කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සතු වාහන කොපමණ සංඛ්‍යාවක් බාහිර පාර්ශවයන් වෙත මුදාහැර තිබේද;

(ii) එම වාහනවල වර්ගය, අංකය සහ මුදාහල දිනය කවරේද;

(iii) කවර ආයතනයක් හෝ පුද්ගලයන් වෙත කවර පදනමක් මත මුදාහැර තිබේද;

(iv) අනුයුක්ත කිරීමක් සිදුකර තිබේනම් ඔවුන්ගේ නම හා තනතුර කවරේද;

(v) එම වාහන මුදාහැරීමට නිසි අනුමතියක් ලබා තිබුණේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සතු ගොඩනැගිලි බදු හෝ කුලී පදනමින් බාහිර පාර්ශ්වයන් වෙත ලබා දී තිබේද;

(ii) එකී ගොඩනැගිලි පිහිටි ස්ථානයන්හි ලිපිනය සහ අදාළ බදු හෝ කුලී පදනම කවරේද;

(iii) ලබා දී ඇති ආයතන හෝ පුද්ගලයින්ගේ නම සහ ලිපිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහි ද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0527/'08

ගරු අනුර දිසානායක මහතා,— වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යතුමා සහ වරාය හා ගුවන්සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) "මිහින් එයාර්" ගුවන් සමාගම සතු ගුවන් යානා මිල දී ගත් ඒවාද, නොඑසේනම් බදු පදනමින් ලබාගත් ඒවාද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මිල දී ගත් ගුවන් යානා නම්, අනුගමනය කළ මිල දී ගැනීමේ පටිපාටිය කවරේද;

(ii) මිල දී ගනු ලැබුවේ කවර මිල ගණන් වලටද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) බදු පදනමින් ලබාගත් ගුවන් යානා වේ නම්, බදු පදනමින් ලබාගත්තේ කවදාද;

(ii) ඒ සඳහා ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කළේ නම් ඒ කවදාද;

(iii) එලෙස ගනු ලැබූ ගුවන් යානා සඳහා මුදල් ගෙවනු ලබන පදනම, ගෙවනු ලබන මුදල් ප්‍රමාණය සහ අදාළ කොන්දේසි කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඈ) (i) බදු පදනමින් ගනු ලැබූ ගුවන් යානා සඳහා මෙතෙක් ගෙවනු ලැබූ මුදල් ප්‍රමාණය එක් එක් මාසය සඳහා වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) හිඟ මුදල් තිබේ නම් ඒ කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0605/'08

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) දැයට කිරුළ – 2008 ප්‍රදර්ශනය මගින් කොපමණ ආදායමක් ඇස්තමේන්තු කරන ලද්දේද;

(ii) මෙම ප්‍රදර්ශනය කවර ආයතනයක කොපමණ බිම් ප්‍රමාණයක පවත්වාගෙන යන ලද්දේද;

(iii) ප්‍රදර්ශනය වෙනුවෙන් රජයේ හෝ පෞද්ගලික අංශය සඳහා වෙළඳ කුටි ලබාදුන්නේද;

(iv) එසේ ලබා දුන්නේ නම්, මෙම වෙළඳ කුටි, වෙළඳ බලපත්‍ර අලෙවියෙන් කොපමණ මුදලක් ලබාගත්තේද;

(v) මෙම ප්‍රදර්ශනය නැරඹීම සඳහා ටිකට් පත් කොපමණ ප්‍රමාණයක් මුද්‍රණය කළේද;

(vi) ඒ අතුරින් කොපමණ ප්‍රමාණයක් අලෙවි කළේද;

(vii) ටිකට් පත් අලෙවියෙන් ලැබුණු මුදල් කවර කටයුත්තක් සඳහා යෙදවීමට අපේක්ෂා කළේද;

(viii) උපයාගත් මුදල් කොපමණ ප්‍රමාණයක් ඒ සඳහා යොදවා තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0730/'08

ගරු එන්. ඩී. එන්. පී. ජයසිංහ මහතා,— කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) නුවරඑළිය දිස්ත්‍රික්කයේ එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ඇති ගොවිජන කේන්ද්‍ර සංඛ්‍යාව කොපමණද;

(ii) එක් එක් ගොවිජන සේවා මධ්‍යස්ථානයේ ලියාපදිංචි වී ඇති වී, එළවළු, මල්, පළතුරු හා වෙනත් ගොවීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දැනට රජයෙන් ලබාදෙන පොහොර සහනාධාරය ලබාදෙන්නේ කවර ගොවීන් සඳහාද;

(ii) ඒ සඳහා වාර්ෂිකව ලබාදෙන පොහොර ප්‍රමාණය සහ ඒ සඳහා වැයවන මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) එළවළු ගොවීන් සඳහා පොහොර සහනාධාරය ලබාදෙන්නේද;

(ii) එළවළු ගොවීන් සුරක්ෂිත කිරීම සඳහා අදාළ අමාත්‍යාංශය සතුව නව ක්‍රියාමාර්ග තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0884/'08

ගරු පේමසිරි මානගේ මහතා,— වෙළෙඳ, අලෙවි සංවර්ධන, සමූපකාර හා පාරිභෝගික සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) ශ්‍රී ලංකාවට ආනයනය කරන අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පසුගිය වසර තුන තුළ ලූණු ආනයනය කරනු ලැබුවේද;

(ii) එසේ නම්, ඒ කොපමණ ප්‍රමාණයක්ද;

(iii) ලූණු ආනයනය කළේ කවර රටවල් වලින්ද;

(iv) ඒ සඳහා වැය කළ මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ලූණු ආනයනය කළ සමාගම්වල නම් හා ලිපිනයන් කවරේද යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0889/’08

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2004 දෙසැම්බර් මස 26 වැනි දින, සුනාමි ව්‍යසනය නිසා පදිංචිව සිටි නිවාස අහිමි වූ පවුල් සංඛ්‍යාව හා නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) රජයේ මැදිහත්වීම යටතේ මෙතෙක් ස්ථිර නිවාස ලබාදුන් හෝ ස්ථිර නිවාසයක ජීවත්වීමට වන්දි මුදල් ලබාදුන් පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සෘජුවම රජයේ මැදිහත්වීමකින් තොරව විවිධ සංවිධාන හා පුද්ගලයන් මැදිහත්වී ස්ථිර නිවාස ලබාදුන් පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) එසේ ස්ථිර නිවසක ගැටළුව විසඳා ගත් පවුල් සංඛ්‍යාව කොපමණද;

(iii) සුනාමියෙන් නිවාස අහිමිවූ, මේ දක්වා ස්ථිර නිවාසයක් නොමැති පවුල් සංඛ්‍යාව කොපමණද;

(iv) සුනාමිය නිසා නිවාස අහිමිව තාවකාලික පදිංචිය සහිත පවුල් සංඛ්‍යාව දිස්ත්‍රික්ක අනුව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0890/’08

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2004 දෙසැම්බර් මස 26 වැනි දින සුනාමි අවස්ථාව වන විට ශ්‍රී ලංකා රජය ගෙවීමට නියමිතව තිබූ විදේශ ණය ප්‍රමාණය කොපමණද;

(ii) සුනාමිය හේතු කොට ගෙන ශ්‍රී ලංකා රජයට මේ දක්වා මුදලින් ලැබුණු විදේශ ආධාරවල (ණය නොවන) වටිනාකම කොපමණද;

(iii) ගෙවීමට තිබූ විදේශ ණය වලින් එම රටවල් සමග එකඟතාවකට පැමිණ නොගෙවා කපා හරින ලද විදේශ ණය ප්‍රමාණය කොපමණද;

(iv) ඒ අනුව 2004 දෙසැම්බර් 26 සුනාමි අවස්ථාවෙන් පසු ඒ වන විට තිබූ විදේශ ණය ප්‍රමාණයෙන් නිදහස් වූ ණය මුදලේ වටිනාකම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) සුනාමිය හේතු කොටගෙන ශ්‍රී ලංකා රජයට මුදලින් ආධාර ලබාදුන් (ණය නොවන) විදේශීය සංවිධාන හා රටවල් කවරේද;

(ii) ලබාදුන් මුදල කොපමණද;

(iii) සුනාමිය හේතු කොට ගෙන, රජය ගෙවීමට නියමිතව තිබූ ණය මුදල් කපා හරින ලද සංවිධාන හෝ රට කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0891/’08

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— නාගරික සංවර්ධන හා පූජාභූමි සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2008 සාර්ක් සමුළුවට ආසන්න කාලය තුළ, කොළඹ දිස්ත්‍රික්කයේ අනවසර ඉදිකිරීම් නිසා හෝ ආරක්ෂක හේතු මත කඩා ඉවත් කළ සම්පූර්ණ නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ කවර ස්ථානවලද;

(iii) ඒ අනුව පදිංචි නිවාස අහිමි වූ පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) කඩා ඉවත් කිරීම නිසා නිවාස අහිමිවීමෙන් පසු රජය මැදිහත්ව ස්ථිර නිවාස ලබාදුන් පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) තාවකාලික නිවාස ලබාදුන් පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0914/'08

ගරු ජේමසිරි මානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ මේ වනවිට සේවය කරන ආගමන හා විගමන නිලධාරීන් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ රාජකාරී කටයුතු සඳහා අවශ්‍ය වන ආගමන හා විගමන නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ රාජකාරී කටයුතු සඳහා දැනට සිටින නිලධාරීන් සංඛ්‍යාව ප්‍රමාණවත්වේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) 1980, 1990, 1995, 2000 සහ 2007 යන වර්ෂවලදී මෙරටට පැමිණි පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0558/'08

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) පසුගිය වර්ෂ විස්ස මුළුල්ලේ එක් එක් වර්ෂය තුළ ශ්‍රී ලංකා රජය වෙත ණය ලබා දුන් රටවල, ජාත්‍යන්තර මූල්‍ය සම්පාදන ආයතනවල හෝ බැංකුවල සහ පෞද්ගලික ආයතනවල නම් කවරේද;

(ii) ඉහත (i) ප්‍රශ්නයේ සඳහන් ණය මුදල්වල අද වන විට හිඟව තිබෙන මුළු ණය ප්‍රමාණය කොපමණද;

(iii) ඉහත (i) ප්‍රශ්නයේ සඳහන් ණය මුදල්වල 1999 වර්ෂයේ අවසානය වන විට හිඟව තිබූ මුළු ණය ප්‍රමාණය කොපමණද;

(iv) 1999 වර්ෂයේ සිට මේ දක්වා එක් එක් වර්ෂය තුළ රටවල් හෝ ආයතන විසින් ලබාදෙන ලද ණය මුදල් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) පොලී අනුපාතිකයන් සහ ණය ආපසු ගෙවීමේ කාල පරිච්ඡේදයන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අද දක්වා ලබා ගත් ණය මුදල් ද සමගින්, 2000 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාලය තුළ එක් එක් වර්ෂය සඳහා මුළු ණය ක්‍රමක්ෂය (ගෙවිය යුතු මුල් මුදල සහ පොලිය) කොපමණද;

(ii) ඉහත අගයන් එක්සත් ජනපද ඩොලර් සහ විශේෂ ගැනුම් හිමිකම් (SDR) වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2009 ජනවාරි මස 08 වැනි බ්‍රහස්පතින්දා
## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0521/'08

ගරු අනුර දිසානායක මහතා,— කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) මොරගහකන්ද ජලාශය ඉදිකිරීම් ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත මුළු මුදල කොපමණද;

(ii) 2007 වර්ෂය සඳහා කොපමණ මුදලක් වෙන් කර තිබේද;

(iii) මෙම ව්‍යාපෘතිය සඳහා විදෙස් ණය හෝ ප්‍රදාන ලබා දෙන්නේද;

(iv) මෙම ව්‍යාපෘතිය අවසන් කිරීමට නියමිත අවුරුදු ගණන කොපමණද;

(v) එක් එක් අවුරුද්ද සඳහා වෙන් කිරීමට අපේක්ෂිත මුදල් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම ව්‍යාපෘතිය නිසා අවතැන්වන පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුනට ලබාදීමට යෝජිත ඉඩම් පිහිටා තිබෙන ප්‍රදේශය සහ එක් පවුලක් සඳහා දෙනු ලබන ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) ඉඩම්වලට අමතරව අවතැන්වූවන් සඳහා දෙනු ලබන අනෙකුත් පහසුකම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මෙම ව්‍යාපෘතිය සඳහා පරිසර බලපෑම් තක්සේරු වාර්තාවක් සකස්කර තිබේද;

(ii) එසේ නම්, ඒ කවදාද;

(iii) එහි නිර්දේශයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඈ) (i) මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීම සඳහා වූ උත්සවයට වියදම් වූ සමස්ත මුදල කොපමණද;

(ii) එහිදී ප්‍රචාරක කටයුතු භාරව සිටි සමාගම කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) රූපවාහිනී දැන්වීම්, පෝස්ටර්, පුවත්පත් දැන්වීම්, ප්‍රචාරක පුවරු ආදිය හා වෙනත් ප්‍රචාරක කටයුතු සඳහා අදාළ සමාගම වෙත ගෙවන ලද මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඊ) නොඑසේ නම්, ඒ මන්ද?

0609/’08

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2000 වර්ෂයේ මැයි මස වන විට පැවති රාජ්‍ය බැංකු පොලී ප්‍රමාණයන් කවරේද;

(ii) 2003 ජනවාරි මස වන විට පැවති පොලී ප්‍රමාණයන් කවරේද;

(iii) 2005 මැයි මස වන විට පැවති රාජ්‍ය බැංකු පොලී ප්‍රමාණයන් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2001 පාර්ලිමේන්තු මැතිවරණයෙන් බලයට පත් රජය කවරේද;

(ii) 2004 පාර්ලිමේන්තු මැතිවරණයෙන් බලයට පත් රජය කවරේද;

(iii) 2004 වර්ෂයේ පත්වූ රජයට පසු මේ දක්වා පොලී අනුපාතයන් වැඩිවීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0127/’08

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 1979 අංක 63 දරන පළාත් පාලන නිවාස (සංශෝධන) පනත යටතේ, බස්නාහිර පළාතේ ඇති නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) ප්‍රදේශ අනුව නිවාස යෝජනාක්‍රම සංඛ්‍යාව වෙන් වෙන්ව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) වසර 20ට වැඩි කුලී පදනම මත ඇති නිවාස ඒ ඒ පළාත් පාලන ආයතනය විසින්, දේපළ බැහැර කිරීමේ සාධන පත්‍රයක් මගින් අයකිරීමක් නොමැතිව පවරා දෙන්නේද; සහ

(ii) එයට බාධාවක් ඇත්නම් ඒ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0614/’08

ගරු වයි. එම්. නවරත්න බණ්ඩා මහතා,—අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2007 දෙසැම්බර් මස පැවති අධ්‍යයන පොදු සහතික පත්‍ර (අ.පො.ස.) සාමාන්‍ය පෙළ විභාගයට ඉදිරිපත් වූ සිසුන්ගෙන් සියලුම සිසුන් අසමත් වූ පාසල් තිබේද;

(ii) එසේ නම්, එම පාසල් සංඛ්‍යාව කොපමණද;

(iii) එක් එක් පාසල අනුව විභාගයට පෙනී සිටි සිසුන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත පාසල්වල අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයට නියමිත විෂයයන් ඉගැන්වීමට අවශ්‍ය ගුරුවරුන් සිටියේද;

(ii) නොසිටියේ නම්, ඒ කවර විෂයයන් සඳහාද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

916/'08

ගරු ජේමසිරි මානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) විගණකාධිපති දෙපාර්තමේන්තුව යටතේ විගණන කටයුතු සඳහා අවශ්‍ය වන නිලධාරීන් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) විගණකාධිපති දෙපාර්තමේන්තුවේ දැනට සේවයේ නියුතු සහකාර විගණකාධිපති, විගණන අධිකාරී හා විගණන පරීක්ෂකවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත සඳහන් කළ තනතුරු සඳහා පුරප්පාඩු පවතින්නේද;

(ii) එසේනම්, ඒ කොපමණ සංඛ්‍යාවක්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0435/'08

ගරු ජේමසිරි මානගේ මහතා,— අපනයන සංවර්ධන හා ජාත්‍යන්තර වෙළෙඳ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2006 වර්ෂය තුළ අපනයනය හා ආනයනය කරන ලද එළවළු, පළතුරු, ධාන්‍ය හා කුළුබඩු ප්‍රමාණයන් හා ඒවායේ උපවර්ග ප්‍රමාණයන් කොපමණද;

(ii) ඒ සඳහා වැයවූ වියදම හා ඉපයූ ආදායම ඇමරිකානු ඩොලර් හා රුපියල් වලින් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඒ සම්බන්ධව කටයුතු කළ ආනයනකරුවන් හා අපනයනකරුවන් කවුරුන්ද;

(iv) ඔවුන්ගේ ආයතනයන්හි නම, ලිපිනය හා දුරකථන අංක කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් ආහාර වර්ග දේශීයව නිෂ්පාදනය කරන නිෂ්පාදකයන්ගේ නම, අදාළ ආයතනය, ලිපිනය හා දුරකථන අංක කවරේද;

(ii) එම ආහාර වර්ග නිෂ්පාදනය කර විදේශ විනිමය ඉතිරි කර ගැනීමට රජය සතු ක්‍රමවත් වැඩපිළිවෙලක් තිබේද;

(iii) එසේ නම්, ඒ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0612/'08

ගරු ජේමසිරි මානගේ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2007 සහ 2008 වර්ෂයන්ට අදාළව දකුණු පළාත් සභාවේ එක් එක් මන්ත්‍රීවරයා සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලබා දුන්නේද;

(ii) එසේ නම්, ඒ කොපමණ මුදල් ප්‍රමාණයක්ද;

(iii) එකී ප්‍රතිපාදන යොදාගෙන දකුණු පළාත් සභාවේ මන්ත්‍රීවරුන් විදේශ සංචාර සිදුකර තිබේද;

(iv) එසේ නම්, එලෙස විදේශ සංචාර කළ මන්ත්‍රීවරුන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එලෙස විදේශ සංචාර සිදුකළ මන්ත්‍රීවරුන්ගේ නම් සහ අදාළ දේශපාලන පක්ෂ කවරේද;

(ii) විදේශ සංචාර කළ රටවල් හා වැය කරන ලද මුදල් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0172/'08

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) රාජ්‍ය අනුග්‍රහය ඇතිව, අනුරාධපුර දිස්ත්‍රික්කයේ මාතලේ හන්දිය, කුරුන්දන්කුලමේ සී/ස ජනතා ලංකා මිරිස් සමාගම නමින් සමාගමක් පිහිට වූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේනම් එම සමාගමේ සභාපතිවරයා කවුරුන්ද;

(ii) අධ්‍යක්ෂ මණ්ඩලයක් හෝ නිලධාරි මණ්ඩලයක් පත්වූයේ නම්, ඔවුන්ගේ නම් හා ලිපිනයන් කවරේද;

(iii) සමාගම පිහිටුවීම සඳහා උතුරු මැද පළාත් සභාවේ හෝ රජයේ මුදල් හෝ සම්පත් යෙදවූයේද;

(iv) එසේනම් මුදල් යෙදූ ආයතන හා මුදල් ප්‍රමාණය කොපමණද;

(v) වෙනත් පහසුකම් සැලසුවේ නම් ඒ කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) මෙම සමාගමට ගොවීන් සාමාජිකයින් ලෙස බඳවා ගත්තේද;

(ii) එසේනම් ඔවුන්ගේ නම්, ලිපිනයන්, කොටස් මුදල, සාමාජික මුදල හෝ එලෙස එකතු කර ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

(iii) සාමාජික මුදල් යෙදවූයේ කවර කටයුත්තක් සඳහා ද;

(iv) සාමාජික කොටස් මුදල් ආපසු ලබාදීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහි ද?

(ඈ) (i) අතහැර දමා තිබූ මෙම සමාගම නැවත ආරම්භ කළේ නම් ඒ කවදාද;

(ii) ඒ සඳහා ගමනැගුම ව්‍යාපෘතිය මගින් මුදල් වෙන්කර තිබේනම්, අදාළ මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0307/'08

ගරු රංජිත් අලුවිහාරේ මහතා,—කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ගොවිජන සේවා දෙපාර්තමේන්තුවට අනුයුක්ත වූ කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර I වැනි ශ්‍රේණිය සඳහා අවශ්‍ය සුදුසුකම් කවරේද;

(ii) එම I වැනි ශ්‍රේණියේ තනතුරු ලබා ගැනීම සඳහා කිසියම් හෝ පිරිසක් ව්‍යාජ අධ්‍යාපන සහතික ඉදිරිපත් කර තිබේද;

(iii) එසේ නම්, ඒ කවුරුන්ද;

(iv) එසේ ව්‍යාජ සහතික ඉදිරිපත් කළ කිසියම් හෝ සේවකයෙක් II වැනි ශ්‍රේණියට පත්කර සහන සලසා තිබේද;

(v) ඔවුන්ගේ නම් සහ මූලික සුදුසුකම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙහිදී රාජ්‍ය ප්‍රතිපත්තිවලට අනුකූල නොවන පරිදි තවත් පිරිසකගේ මානව හිමිකම් කඩවන අයුරින් කටයුතු කර ඇති බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) මූලික සුදුසුකම් නොමැතිව අසාධාරණයට ලක්ව සිටින අයට II වැනි ශ්‍රේණියේ හිමිකම් ලබාදීමට එතුමා කටයුතු කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0048/'08

ගරු රවි කරුණානායක මහතා,—මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) ලිමිටඩ් (HDL) සමාගමට අයත් හිල්ටන් හෝටලය පිහිටා ඇති අක්කර 7කට වැඩි ඉඩම 1999 ජූලි මස විශේෂ ප්‍රදාන අංක 673 සහ 674 පවරාදීමට අනුව රජය වෙත පැවරී තිබෙන බව; හා

(ii) මෙම ඉඩම නැවත රජය වෙත පවරා තිබෙන බව;

එතුමා දන්නෙහිද?

(ආ) (i) 1999 ජූලි මස සිට මෙම ඉඩම පරිහරණය වෙනුවෙන් HDL සමාගම විසින් ගෙවූ මුදල කොපමණද;

(ii) මුදල් ගෙවනු නොලැබුවේ නම්, එම පහසුකම සෙසු අයටත් ලබා දෙන්නේද;

(iii) HDL සමාගම බංකොලොත්වී ඇති බැවින් එය විසුරුවා හැරීම සඳහා අයදුම්පත්‍රයක් ගොනුකර තිබේද;

(iv) 2007 මැයි මස 03 වැනි දිනෙන් පසු HDL සමාගම විසුරුවා හැරීමට අමාත්‍ය මණ්ඩලය විරුද්ධ වී තිබේද;

(v) එසේ නම්, 2007 අංක 7 දරන සමාගම් පනත අනුව රජයේ ණය සඳහා වන හිමය, ආපසු රජයට ගෙවීමේ වගකීම පුද්ගලිකව අමාත්‍ය මණ්ඩලය බාර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0057/'08

ගරු රවි කරුණානායක මහතා,— කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) පසුගිය වර්ෂ තුන තුළ කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමා විසින් කරන ලද විදේශ සංචාර සංඛ්‍යාව කොපමණද;

(ii) සංචාරය කරන ලද රටවල් කවරේද; සහ

(iii) ප්‍රවේශ පත්‍ර සඳහා වියදම් සහ හෝටල් ගාස්තු වෙන් වෙන් වශයෙන් සඳහන් කරමින් ඉහත සඳහන් එක් එක් සංචාරයේ වියදම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම සංචාරවලදී කැටුව යන ලද පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම් සහ ඔවුන් සඳහා දැරීමට සිදු වූ වියදම් වෙන් වෙන් වශයෙන් කොපමණද; සහ

(iii) ඉහත සඳහන් එක් එක් විදේශ සංචාරය සඳහා හේතුව කුමක්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මේ සඳහා අයවැයෙන් වෙන් කරන ලද දීමනාව කොපමණද; සහ

(ii) එවැනි සංචාර සඳහා සපයනු ලැබූ පරිපූරක වැය ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0617/'08

ගරු විජිත හේරත් මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) රාජ්‍ය සේවයට අයත් ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ දැනට පවතින තනතුරු සංඛ්‍යාව කොපමණද;

(ii) එම තනතුරුවල දැනට පවතින පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(iii) ඉහත පුරප්පාඩු සංඛ්‍යාවෙන් 11/11 ශ්‍රේණියේ පුරප්පාඩු පිරවීම සඳහා ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයට බඳවා ගැනීම, විවෘත හා සීමිත තරඟ විභාගයේ ප්‍රතිඵල මත සිදු කරන්නේද;

(iv) එලෙස බඳවා ගනු ලබන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එසේ නම්, එම බඳවා ගැනීම් සිදු කරන දිනය හා බඳවා ගැනීමේ පටිපාටිය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0618/'08

ගරු විජිත හේරත් මහතා,— ජාතිය ගොඩනැඟීමේ හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) 2006 වර්ෂයේ ප්‍රාදේශීය සැලසුම්කරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව හදාරා ඇති ජාතිය ගොඩනැඟීමේ හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශයේ සංවර්ධන නිලධාරීන්ට, පාඨමාලාව හැදෑරීම වෙනුවෙන් ප්‍රතිපාදන මුදල් ඉල්ලීම් කර තිබුණද, එම මුදල් ලබා නොදෙන්නේ කවර හේතුවක් නිසාද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) අදාළ අමාත්‍යාංශයේ හා වෙනත් අමාත්‍යාංශවල මෙම පාඨමාලාව හැදෑරූ නිලධාරීන් පිරිසකට පමණක් මෙම ප්‍රතිපාදන ලබා දීමේ පදනම කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) හිතවත් නිලධාරීන්ට පමණක් මුදල් ලබාදීමේ පදනම වෙනස් කර ඉහත අමාත්‍යාංශයේ සේවයේ නියුතු අදාළ නිලධාරීන්ට ද එම මුදල් ලබා දෙන්නේද;

(ii) එසේ නම්, ඒ කවදාද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2009 ජනවාරි මස 09 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0301/'08

ගරු රංජිත් අලුවිහාරේ මහතා,—කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් වෙහෙරගල කොට්ඨාසයේ රුහුණුගම ඒකකයේ අංක 125 දරන ඉඩමේ වර්ෂ 10ක පමණ කාලයක සිට එල්. කේ. නිමල් නමැති අයෙකු දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකර ස්ථිරව පදිංචිවී සිටින බවත්;

(ii) මෙම ගොඩනැගිල්ලට විදුලිය ලබා ගැනීම සඳහා වෙහෙරගල කොට්ඨාස කළමනාකරු විසින් අයිතිය තහවුරු කර විදුලි බල මණ්ඩලයට ලිපියක් ලබා දී ඇති බවත්;

(iii) මොවුන්ගේ නම් මැතිවරණ නාමාවලියට ඇතුළත්ව ඇති බවත්;

එතුමා දන්නෙහි ද?

(ආ) (i) මෙම ඉඩම සහ ගොඩනැගිල්ල ආපසු මහවැලි අධිකාරියට පවරා ගැනීම සඳහා, පොළොන්නරුව මහේස්ත්‍රාත් අධිකරණයේ අංක 44/149/06 දරන නඩුව පවරා ඇත්තේ හුදෙක් දේශපාලන පළිගැනීමක් ලෙස බවත්;

(ii) 2004 මහ මැතිවරණයේදී මහවැලි ආරක්ෂක නිලධාරීන් විසින් මොහුගේ නිවසට වෙඩි තබා පලාගිය බවත්;

(iii) මේ පිළිබඳව අරලගන්විල පොලිසියේ පැමිණිල්ලක් කර ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) මොහුගේ මෙම ඉඩම වටා ඇති අනෙකුත් සියලුම ඉඩම් මුල් ඉඩම්ලාභීන්ගෙන් පවරාගෙන භුක්ති විඳින ඒවා වන අතර, එම ඉඩම් සම්බන්ධයෙන් මෙවැනි කිසිදු අධිකරණ ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත්තේ කවර හේතුවක් නිසාද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නිමල් මහතාට තවදුරටත් ඔහුගේ නිවස හා ඉඩම භුක්ති විඳීමට අවශ්‍ය කටයුතු සලසන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0304/'08

ගරු රංජිත් අලුවිහාරේ මහතා,—කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ වික්ටෝරියා කලාපයට අයත් අඹකොටේවත්තෙන් විකල්ප පදනම යටතේ ඉඩම් ලබා ඇති පදිංචිකරුවන් වාර්ෂික බදු මුදල් ගෙවිය යුතු බවට නියෝගයක් පනවා ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) 1983 දක්වා අඹකොටේවත්තේ වතු කම්කරුවන් ලෙස සේවය කළ මොවුන්ට, වික්ටෝරියා ජලාශයට යටවූ ඉඩම්වල සිටි පදිංචිකරුවන් ලෙස අදාළ වතුයායේ ඉඩම් ලබාදීම හේතුකොට ගෙන රැකියාව අහිමිවූ බවත්;

(ii) ඔවුන්ගේ ගව පට්ටි හා කුකුල් පාලනය වැනි අතුරු ආදායම් මාර්ගද ඇනහිටි බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) මොවුන්ට ලබා දී ඇති මහවැලි ඉඩම් වලින් බදු මුදල් අයකර ගැනීම නවතා සහනයක් සලසාදීමට එතුමා පියවර ගන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0347/'08

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2004 වර්ෂයේ නව රජය බලයට පත්වීමෙන් පසු අදාළ නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් මේ දක්වා විදේශ සංචාරය කළ රටවල් කවරේද;

(ii) එතුමා විසින් කරන ලද නිල හා පෞද්ගලික විදේශ සංචාර වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම සංචාර සඳහා එතුමා සමඟ සහභාගී වූ නිලධාරීන්ගේ නම් හා තනතුරු කවරේද;

(ii) එතුමාගේ පෞද්ගලික කාර්ය මණ්ඩල නිලධාරීන් සහභාගී වූයේ නම් ඔවුන්ගේ නම් හා තනතුරු කවරේද;

(iii) එතුමා ඇතුළු අනෙකුත් නිලධාරීන් විදේශගත වූ ගුවන් සමාගම හා ගුවන් පන්තිය කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) මෙම විදේශ සංචාර වලින් මෙරටට ලැබුණු විදේශ ආධාර, විදේශ ණය, ව්‍යාපෘති හෝ වෙනත් ප්‍රතිලාභයන් කවරේද යන්න එක් එක් සංචාරයට අදාළව වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0512/'08

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) පරිසර හිතකාමී, බැටරි බලයෙන් ක්‍රියාත්මක වන මෝටර් රථ ලංකාවට ආනයනය කරන බව එතුමා දන්නෙහිද?

(ආ) එම වාහන ලංකාවට ආනයනය කරන රටවල් සහ දේශීය නියෝජිතයින් කවුරුන්ද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ලංකාවේ වාහන වලින් සිදුවන පරිසර විනාශය වැළැක්වීම සඳහා බැටරි බලයෙන් ක්‍රියා කරන මෙම මෝටර් රථ ඉතා යෝග්‍ය බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) (i) පරිසර හිතකාමී වන මෙම මෝටර් රථ ගෙන්වීමේදී ආනයනික බදු සහන ලබා දීමට ක්‍රියා කරන්නේද;

(ii) මෙම වාහන එකලස් කිරීමේ කර්මාන්ත ශාලා ලංකාවේ ආරම්භ කිරීමට අවස්ථාව ලබා දෙන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0625/'08

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) මහරගම නගර සභා සීමාවේ පිහිටි බොරලැස්ගමුව වැවෙහි ජලය අපවිත්‍ර වීම පිළිබඳව ගොවි සමිති ඇතුළු ජනතාව, වගකිව යුතු ආයතන වෙත පැමිණිලි කර ඇති බවත්;

(ii) නියෝජ්‍ය අධ්‍යක්ෂ (අපද්‍රව්‍ය කළමනාකරණ) ගේ 2008.03.25 දිනැති අංක 07/09/එන්ඩබ්එම්/11/2008 දරන ලිපිය මගින් ජලය අපවිත්‍ර බවට සනාථ වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) කොළඹ වාරිමාර්ග ඉංජිනේරු විසින් මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් වෙත යවන ලද ලිපියකින් ජලය පිළිබඳව ඇගයීම් වාර්තාවක් හා ගත හැකි ක්‍රියාමාර්ග විමසා ඇති බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) වැසි ජලය අපවිත්‍ර වීමට හේතු කවරේද;

(ii) එයට වගකිව යුත්තේ කවුරුන්ද;

(iii) පරිසර විනාශය වැළැක්වීමට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0666/'08

ගරු සමන්සිරි හේරත් මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) පල්ලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි කොළඑලිය වැවට සහ වැව් රක්ෂිතයට අයත් මුළු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) මෙමගින් අස්වද්දන මුළු කුඹුරු ඉඩම් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 1984 වර්ෂයේ කොළඑලිය වැව ප්‍රතිසංස්කරණය කිරීමට පෙර වැව් පත්ලට යටවන බවට හඳුනාගත් වගුරු බිම් ප්‍රමාණය කොපමණද;

(ii) මෙම ඉඩම්වල හිමිකරුවන් කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) එලෙස හඳුනාගත් අයට වැවේ ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කිරීමට පෙර නීත්‍යානුකූලව විකල්ප ඉඩම් ලබාදීමට කටයුතු කර ඇති බව එතුමා දන්නෙහිද?

(ඈ) එලෙස විකල්ප ඉඩම් හිමි වූ අයගේ නාමලේඛනය, ලබාදුන් මුළු ඉඩම් ප්‍රමාණය, දිනය, සහ ඒ සඳහා සහභාගී වූ ආයතන නිලධාරීන්ගේ නම් කවරේද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) විකල්ප ඉඩම් ලබා දුන් පසුවද, වැව් පත්ලට යටවන වගුරුබිම් සඳහා හිමිකම් ඇති කිහිපදෙනෙක් ඉන් ඉවත් කිරීමට මෙතෙක් නීත්‍යානුකූලව කටයුතු කර නොමැති බව එතුමා පිළිගන්නෙහිද?

(ඊ) (i) විකල්ප ඉඩම් ලබාදී තිබියදීත් මොවුන් ඉවත් නොකිරීමට හේතු කවරේද;

(ii) මෙම ඉඩම්වල නීත්‍යානුකූල නොවන අයුරින් ඉදිකිරීම්, විදුලි රැහැන් ඇදීම් සිදුවූයේ කෙසේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(උ) නොඑසේ නම්, ඒ මන්ද?

0695/'08

ගරු එම්. ඩී. නාමල් කරුණාරත්න මහතා,— පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) කුරුණෑගල, අනුරාධපුර සහ මාතලේ යන දිස්ත්‍රික්කවල කහල්ල, පල්ලේකැලේ අභයභූමියේ ඇති පාරිසරික වටිනාකම කවරේද යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) මෙම අභය භූමියේ මායිමේ ඇති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල අලි - මිනිස් ගැටුම උග්‍රවීම නිසා මියගොස් ඇති මිනිසුන් සංඛ්‍යාව සහ අලි සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මෙම අලි - මිනිස් ගැටුම අවම කිරීමට ගෙන ඇති පියවර කවරේද;

(iii) අලි - මිනිස් ගැටුම අවම කිරීමේ අරමුණින් ඉදිකර ඇති විදුලි වැටේ ගලන විද්‍යුත් ධාරාව ප්‍රමාණවත්ද;

(iv) අදාළ විද්‍යුත් ධාරාව ප්‍රමාණවත් නොවේ නම් ප්‍රධාන විදුලි පද්ධතියෙන් විදුලිය සැපයීමේ සූදානමක් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) දැනට පවතින විදුලි වැටේ පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කොටස පුළුල් කිරීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, ඒ කොපමණ ප්‍රමාණයකින්ද;

(iii) එම පුළුල් කිරීමේදී අභය භූමිය තුළට ගැනෙන නිවෙස් හා ගෙවතු වෙනුවෙන් වන්දි හා විකල්ප ඉඩම් ලබා දෙන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0697/'08

ගරු එම්. ඩී. නාමල් කරුණාරත්න මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) සීමාසන්න ක්‍රමය යටතේ රජයේ ඉඩම් වර්ෂ 30 ක කාලයක් සඳහා බදුදීම නවතා තිබේද;

(ii) එසේනම් ඊට හේතුව කවරේද;

(iii) එවැනි ඉඩම් නිදහස් දීමනාපත්‍ර මගින් ලබාදීමේ ක්‍රමයක් තිබේනම් එය සියලුම සීමාසන්න ඉඩම් සඳහා වලංගු වන්නේද;

(iv) තෝරාගත් අයට පමණක් නිදහස් දීමනාපත්‍ර ලබාදිය හැකි ද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සීමාසන්න ක්‍රමය යටතේ ඉඩම් ලබාදී ඇති හෝ ඊට යෝජනාකර ඇති පුද්ගලයින්ගේ නම්, ලිපිනයන්, ඉඩම් ප්‍රමාණ සහ ඒවායින් පසුගිය වර්ෂ 05 තුළ ලැබුණු බදු ආදායම වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම ඉඩම්වල සංවර්ධිත/අසංවර්ධිත බව හා නඩත්තු තත්වයන් කවරේද;

(iii) සීමාසන්න බදු ඉඩම්වලින් ලැබෙන වාර්ෂික ආදායම යාවත්කාලීන කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) කළුගල්ල ග්‍රාම නිලධාරී වසමේ එම්. එල්. 81 හා 88 බලපත්‍ර මගින් බදු පදනම මත ලබාදී ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) ඒවා තවදුරටත් වලංගු වන්නේද;

(iii) ගැසට් පත්‍රයකින් නිකුත් කිරීමකින් තොරව පුද්ගලික ඉල්ලීමක් මත ඉහත ඉඩම් ලබාදීමට කටයුතු කර තිබේද;

(iv) එම ඉඩම් නිදහස් දීමනාපත්‍ර මගින් එස්. කේ. ඩබ්ලිව්. කරුණාරත්න සහ එස්. ඒ. යු. රාජපක්ෂ යන අයට ලබාදීමට කටයුතුකර තිබේද;

(v) ඉහත කොට්ඨාසයේ අනෙකුත් ඉඩම් සඳහාද නිදහස් දීමනාපත්‍ර ඉල්ලුම් කළ හැකිද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0701/'08

ගරු අජිත් කුමාර මහතා,—අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ගා/නාගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉහල හෝමදොල මූකලාන නමැති ඉඩමක් කන්නලිය රක්ෂිතයට යාබදව පිහිටා තිබෙන බවත්;

(ii) වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට එම ඉඩම් පැවරීමට අංක 04/0858/001/005-III දරන අමාත්‍ය මණ්ඩල තීරණයක් ගෙන ඇත්තේ මෙම ඉඩමද රක්ෂිතයක් ලෙස තැබිය යුතු ඝන වනාන්තරයක් නිසා බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) 2002–2004 කාලය තුළ පැවති රජයේ අමාත්‍යවරයෙකුගේ සම්බන්ධීකරණ ලේකම්වරයෙකුට හෝමදොල මුකලාන ඉඩමෙන් අක්කර 50 ක් ලබාදීම සඳහා 2003 වර්ෂයේ මැනුම් කළ බවත්;

(ii) එසේ මැනීමේදී, මෙම ඉඩමේ විවිධ වර්ගයේ ගස් 2000 කට වඩා තිබුණු බවට වාර්තාවක් අදාළ ගොණුවේ ඇති අතර එවකට ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ගාල්ල දිස්ත්‍රික් අධ්‍යක්ෂ ඇතුළු නිලධාරීන්ගේ විරෝධතාව නිසා මෙම කාර්යය නතර වූ බවත්;

එතුමා පිළිගන්නෙහි ද?

(ඇ) එසේ තිබිය දී දැඩි රක්ෂිතයක් ලෙස තැබිය යුතු ඉහත ඉඩමෙන් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ හෝ පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යතුමාගේ අවසරයකින් තොරව අදාළ අයට අක්කර 50 ක් ලබාදී ඇති බැවින් එය නතර කිරීමට එතුමා අවශ්‍ය පියවර ගන්නෙහි ද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0716/'08

ගරු දයාසිරි ජයසේකර මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) රටෙහි ජීවන වියදම ජනතාවට දැරිය නොහැකි ලෙස ඉහළ ගොස් ඇති බවත්;

(ii) බස්නාහිර පළාතට පමණක් බලපාන පරිදි විශේෂ ගැසට් නිවේදනයක් මගින් භාණ්ඩ හා සේවා මත 05%ක පිරිවැටුම් බද්දක් පනවා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත බදු පනවන ලද භාණ්ඩ හා ඒවා පනවන ලද ආකාරය කවරේද;

(ii) මෙමගින් උපයා ගැනීමට අපේක්ෂිත බදු ආදායම කොපමණද;

(iii) අනෙකුත් පළාත් සභාවන්හි මෙම බදු ක්‍රමය ක්‍රියාත්මක නොවන කල්හි බස්නාහිර පළාතේ පමණක් මෙම භාණ්ඩ හා සේවාවන්හි මිල මට්ටම වැඩි නොවන්නේද;

(iv) රටතුළ එකම භාණ්ඩයන් සඳහා විවිධ මිල ගණන් පැවතීම හේතුවෙන් එම පළාතේ වෙළෙඳපොළ හැසිරීම කෙසේ වන්නේද;

(v) මේ හේතුවෙන් අපේක්ෂිත බදු ආදායම ලබාගත හැකිවේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) රටතුළ ඇති සියලු පළාත් සභාවන්හි මෙම බද්ද පැනවීමට කටයුතු කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0717/'08

ගරු දයාසිරි ජයසේකර මහතා,— පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) ශ්‍රී ලංකාවේ වටිනා සම්පතක් වන අලි සම්පත මේ වනවිට විශාල ලෙස විනාශ වෙමින් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ස්වභාවික නොවන හේතූන් නිසා 1990 වර්ෂයේ සිට මේ දක්වා අලි ඇතුන් 2200ට ආසන්න සංඛ්‍යාවක් මියගොස් තිබීම සම්බන්ධයෙන් අධ්‍යයනයක් සිදුකර තිබේද;

(ii) මෙම අලි මරණ වළක්වා ගැනීම සඳහා මේ වනවිට ක්‍රියාත්මක කර ඇති වැඩසටහන් කවරේද;

(iii) අලි - මිනිස් ගැටුම් හේතුවෙන් මේ වනවිට විනාශ වී ඇති මිනිස් ජීවිත සංඛ්‍යාව කොපමණද;

(iv) පුද්ගල සහ දේපල හානි ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0655/'08

ගරු රවි කරුණානායක මහතා,— වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යතුමා සහ වරාය හා ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) මේ දක්වා වූ පසුගිය වසර 4ක කාලය තුළ එක් එක් වර්ෂයේදී, වරාය හා ගුවන් සේවා අමාත්‍යාංශය විසින් සහ එම අමාත්‍යාංශයට අයත් ඕනෑම සමාගමක් සඳහා කුලියට ගත් එක් එක් වාහනය වෙනුවෙන් ගෙවන ලද මුළු මුදල හා කුලියට ලබා ගත් කාර්යාලයීය ඉඩකඩ සඳහා ගෙවන ලද මුළු මුදල කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) උක්ත කාල සීමාව තුළ—

(i) ඉහත කී වාහන සඳහා ඉන්ධන වෙනුවෙන් වැය කළ මුදල කොපමණද හා එම මුදල අමාත්‍යාංශයේ සමස්ත පුනරාවර්තන වියදම් වලින් කුමන ප්‍රතිශතයක්ද;

(ii) ඉහත සඳහන් කාර්යාලයීය ඉඩකඩ සඳහා එක් වර්ග අඩියක් වෙනුවෙන් වැය කළ මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) කල්බදු ක්‍රමය යටතේ එම ගොඩනැගිල්ල ලබා ගෙන ඇත්තේ කොපමණ කාලයක් සඳහාද හා තැන්පතුවක් ලෙස අත්තිකාරම් වශයෙන් ගෙවන ලද මුදල කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2009 ජනවාරි මස 20 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0608/'08

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2001 වර්ෂයේදී පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට පෙර පැවති රජය විසින් රාජ්‍ය බැංකුවලින් ලබාගෙන තිබූ ණය ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ණය මුදල් ලබාගෙන ඇති වර්ෂ වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2001 වර්ෂයේ පැවති මැතිවරණයෙන් බලයට පත් රජය, රාජ්‍ය බැංකුවලින් ලබාගෙන තිබූ එම ණය මුදල් ගෙවා අවසන් කළේද;

(ii) නොඑසේ නම්, තවදුරටත් එකී රාජ්‍ය කාලය තුළ ගෙවීමට ඉතිරිව තිබූ බැංකු ණය මුදල් ප්‍රමාණය කොපමණද;

(iii) 2004 වර්ෂයේ පවත්වන ලද පාර්ලිමේන්තු මැතිවරණයෙන් බලයට පත් වූ රජය, 2004 වර්ෂයේ සිට මේ දක්වා රාජ්‍ය බැංකුවලින් ලබාගෙන ඇති ණය මුදල් ප්‍රමාණය ඒ ඒ වර්ෂ අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0747/'08

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා,— කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) හේන් ගොවියා අද ඉතාමත් අසරණ තත්වයකට පත්ව, ජීවත්වීමට නොහැකිව ජීවිතය නැති කර ගන්නා තත්වයකට පත්වී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) අද හේන් ගොවියා පොහොර මිටියක් ලබා ගත යුත්තේ රුපියල් 6,000/- ට බවත් එළවළුවලට යොදන සියලුම රසායනික බෙහෙත් වර්ගවල මිල ඉතාමත් ඉහළ ගොස් ඇති බවත් එතුමා පිළිගන්නෙහිද?

(ඈ) (i) අද රටට අවශ්‍ය ප්‍රමාණයෙන් 60% පමණ එළවළු සපයන්නේ හේන් ගොවියා බැවින් ඔවුන්ටද කිලෝ 50ක පොහොර මිටියක් රු 350/-කට සහ අනිකුත් රසායනික බෙහෙත් වර්ග ඒ හා සමාන මිලකට ලබාදීමට අවශ්‍ය පියවර ගන්නෙහිද;

(ii) එසේ නම්, ඒ කවදා සිටද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0715/08

ගරු ජේමසිරි මානගේ මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2008.07.09 වැනි දින ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලය සහ දුම්රිය දෙපාර්තමේන්තුව මගී ප්‍රවාහනයෙන් උපයන ලද ආදායම කොපමණද;

(ii) එදින මගී ප්‍රවාහනය සඳහා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සහ දුම්රිය දෙපාර්තමේන්තුව වැය කළ මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2008.07.10 වැනි දින ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලය සහ දුම්රිය දෙපාර්තමේන්තුව මගී ප්‍රවාහනයෙන් උපයන ලද ආදායම කොපමණද;

(ii) එදින මගී ප්‍රවාහනය සඳහා ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලය සහ දුම්රිය දෙපාර්තමේන්තුව වැය කළ මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0733/'08

ගරු ජේමසිරි මානගේ මහතා,— ධීවර හා ජලජ සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 1994 වර්ෂය වන විට ලංකා ධීවර සංස්ථාව සතුව පැවති ශීතාගාර සංඛ්‍යාව කොපමණද;

(ii) 2008 වර්ෂයේ ජුනි මාසය වන විට ලංකා ධීවර සංස්ථාව සතු ක්‍රියාත්මක ශීතාගාර සංඛ්‍යාව කොපමණද;

(iii) ශීතාගාර බදු දී තිබේද;

(iv) එසේ නම්, ඒ කොපමණ සංඛ්‍යාවක්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශීතාගාර බද්දට දී තිබෙන අයගේ නම් හා ලිපිනයන් කවරේද;

(ii) පෞද්ගලික අංශය විසින් පවත්වා ගෙන යනු ලබන ශීතාගාර සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0734/'08

ගරු ජේමසිරි මානගේ මහතා,— ධීවර හා ජලජ සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) නාරා ආයතනය සතුව තිබූ "සයුරි" නෞකාව හා එහි සවිකර තිබූ ජලමාන උපකරණවල රක්ෂිත මුදල කොපමණද;

(ii) "සයුරි" නෞකාව හා ජලමාන උපකරණ සුනාමියෙන් විනාශයට පත්වීමෙන් අනතුරුව රක්ෂණ වන්දි වශයෙන් ලැබුණු මුදල කොපමණද;

(iii) නාරා ආයතනයේ වත්කම්වලින් නෞකාවේ වටිනාකමේ ප්‍රතිශතය කොපමණද;

(iv) නෞකාව රක්ෂණයේ සිට රක්ෂණ වන්දිය ලබා ගැනීම දක්වා වූ ක්‍රියාවලිය සම්බන්ධයෙන් අමාත්‍යාංශය පරීක්ෂණයක් පවත්වා තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0772/'08

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) අනුරාධපුර, ජේමඩුව, අංක 26 ලිපිනයෙහි පදිංචි එස්. ඒ. සුමිත්‍රා කුමාරි සුරසේන මහත්මිය අනුරාධපුර කලාප අධ්‍යාපන කාර්යාලයේ 2007.04.27 දින පැවති 2007 - ස්වේච්ඡා ගුරුවරුන් බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වූ බවත්;

(ii) ඇය 2000 වර්ෂයේ සිට 2005 වර්ෂය දක්වා තන්තිරිමලේ, අ/කිඹුල්වැව ආනන්ද විද්‍යාලයේ ස්වේච්ඡා ගුරුවරියක ලෙස සේවය කර ඇති බවත්;

එතුමා දන්නෙහි ද?

(ආ) සුරසේන මහත්මිය මෙම තනතුර සඳහා අවශ්‍ය මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා ඇති බව එතුමා පිළිගන්නෙහි ද?

(ඇ) ඇයට ස්වේච්ඡා ගුරු පත්වීමක් ලබාදීමට එතුමා අවශ්‍ය පියවර ගන්නෙහි ද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0644/'08

ගරු තිලකරත්න විතානාච්චි මහතා,— දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ද්‍රවිඩ ජනතාවට විශේෂිත වෛද්‍ය ක්‍රමයක් වන දේශීය සිද්ධ වෛද්‍ය ක්‍රමයට අයත් වෛද්‍යවරු කොපමණ සංඛ්‍යාවක් මේ වනවිට රජයේ රෝහල්වල (පළාත් සෞඛ්‍ය සේවය ද ඇතුළුව) සේවය කරන්නේද;

(ii) එම රෝහල් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සමීක්ෂණ මගින් හඳුනාගත් පරිදි ඉහත සිද්ධ වෛද්‍යවරුන් කොපමණ සංඛ්‍යාවක් රජයේ රෝහල් සඳහා (පළාත් සෞඛ්‍ය සේවය ද ඇතුළුව) අවශ්‍ය වන්නේද;

(ii) ද්‍රවිඩ ජනතාව බහුලව ජීවත් වන හඳුනාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සඳහා අවශ්‍ය සිද්ධ වෛද්‍යවරු පත්කර තිබේද;

(iii) ආරක්ෂක අංශ මගින් මුදාගන්නා ප්‍රදේශ ඇතුළු සියලු ප්‍රදේශ සඳහා සිද්ධ වෛද්‍යවරු පත්කිරීමට කොපමණ කාලසීමාවක් තුළ පියවර ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0645/'08

ගරු තිලකරත්න විතානාච්චි මහතා,— දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) මුස්ලිම් ජනතාවට විශේෂ වූ දේශීය වෛද්‍ය ප්‍රතිකාර ක්‍රමයක් වන යුනානි වෛද්‍යවරුන් කොපමණ සංඛ්‍යාවක් මේ වන විට රජයේ රෝහල්වල (පළාත් සෞඛ්‍ය සේවය ද ඇතුළුව) සේවය කරන්නේද යන්න අදාළ රෝහල් ද සමගින් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) සමීක්ෂණ මගින් හඳුනාගත් පරිදි අවශ්‍ය යුනානි වෛද්‍යවරුන් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහි ද?

(ඇ) (i) මුස්ලිම් ජනතාව බහුල ව ජීවත්වන බවට හඳුනා ගෙන තිබෙන්නේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 23 ක් නම් අවශ්‍ය යුනානි වෛද්‍යවරුන් සංඛ්‍යාව ද 23 ක් බවත්;

(ii) සිංහල, ද්‍රවිඩ සහ මුස්ලිම් යන ජන කොට්ඨාස තුනම ආසන්න ලෙස සමානව ජීවත් වන ඇතැම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සඳහා ආයුර්වේද, සිද්ධ සහ යුනානි වෛද්‍යවරු තිදෙනෙකු අවශ්‍ය බවත්;

(iii) මුස්ලිම් බහුතරයක් සිටින සමහර ප්‍රදේශවල වෛද්‍ය මධ්‍යස්ථාන වලට පවා (උදාහරණයක් ලෙස මඩකලපුව) යුනානි වෛද්‍යවරුන් පත්කර නොමැති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) වෛද්‍ය විද්‍යාලවලින් වාර්ෂික ව සමත්වන යුනානි වෛද්‍යවරුන්ට රැකියා ලබාදී මුස්ලිම් රෝගීන් සඳහා අවශ්‍ය ප්‍රතිකාර ලබාදීමට කොපමණ කාලසීමාවක් තුළ පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2009 ජනවාරි මස 21 වැනි බදාදා
# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0705/'08

ගරු රවි කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2006 ජනවාරි 01 වැනිදා සිට මේ දක්වා ඝාතනය කර ඇති මාධ්‍යවේදීන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ ගැන පරීක්ෂණ ආරම්භකර තිබේද;

(iii) ඝාතකයින් කිසිවෙකු හෝ හඳුනාගෙන හෝ ඔවුන් පිළිබඳ හෝඩුවාවක් ලැබී තිබේද;

(iv) එසේ නම්, ඔවුන්ගේ නම් හෝ මේ දක්වා ගෙන ඇති නීතිමය ක්‍රියාමාර්ග කවරේද;

(v) පහරදීමට ලක්වූ හෝ පැහැර ගෙන යනු ලැබූ මාධ්‍යවේදීන් සංඛ්‍යාව කොපමණද;

(vi) ඒ පිළිබඳව පරීක්ෂණ ආරම්භකර තිබේද සහ ඒ සම්බන්ධයෙන් කිසිවෙකුට එරෙහිව අධිකරණයෙහි චෝදනා එල්ල කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දැනුම් දෙන්නෙහිද?

(ආ) 2007 දෙසැම්බර් 27 වැනි දින බාහිර පුද්ගලයින් විසින් ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවට පහර දෙනු ලැබූ බව එතුමා දන්නෙහිද?

(ඇ) (i) එම සිද්ධියට සම්බන්ධ බාහිර පුද්ගලයින්ගේ නම් හා දේශපාලනඥයාගේ නම කවරේද;

(ii) රූපවාහිනී සංස්ථාවට ඇතුළුවී සේවකයින්ට පහරදුන් එබඳු පුද්ගලයන්ට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) ඒ සම්බන්ධ පරීක්ෂණ ආරම්භකර තිබේද;

(iv) එසේ නම්, අධිකරණයෙහි චෝදනා එල්ලවී ඇති සංඛ්‍යාව කොපමණද;

(v) මෙම සිදුවීම නිසා රූපවාහිනී සංස්ථාවට සිදුවූ අලාභය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0718/'08

ගරු රවි කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ජනාධිපති අරමුදලේ සාමාජිකයින්ගේ නම් කවරේද;

(ii) ජනාධිපති අරමුදල පිහිටවූ දිනය කවරේද;

(iii) වත්මන් සාමාජිකයන්ගේ නිල කාලයට පෙර පැවති නිල කාලය තුළ එම අරමුදලේ සාමාජිකයන්ගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පසුගිය වසර පහක කාලය තුළ ජනාධිපති අරමුදල මගින් සිදුකරන ලද වියදම සහ එම වියදම සිදුකිරීම සඳහා වන එක් එක් වියදම් අයිතමයන්ගේ නම් කවරේද;

(ii) පසුගිය වසර පහ තුළ සිදුකළ රු. 100,000/- ට වැඩි සියලුම වියදම් වාර්ෂික පදනමින් කවරේද;

(iii) ජනාධිපති අරමුදලට ආදායම් ලැබෙන මූලාශ්‍ර කවරේද;

(iv) අද දක්වා වූ පසුගිය වසර පහක කාලය තුළ ඉපැයූ ආදායම් වාර්ෂික පදනමින් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) එම අරමුදලේ ගිණුම් විගණනයට භාජනය කළ අවසන් දිනය සහ එම විගණන වාර්තා එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඈ) (i) අද දක්වා වූ පසුගිය වසර පහ තුළ දේශපාලනඥයන්ට ගෙවූ මුදල වාර්ෂික පදනමින් කවරේද සහ එම එක් එක් අයිතමයන්ට ගෙවීම් සිදුකළ හේතු කවරේද;

(ii) අද දක්වා වූ පසුගිය වසර තුළ දේශපාලනඥයන් කළ ඉල්ලීම්වලින් කොපමණ ප්‍රමාණයක් ප්‍රතික්ෂේප වී තිබේද;

(iii) එම පුද්ගලයන්ගේ නම් සහ එම ඉල්ලීම් ප්‍රතික්ෂේප කිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දැනුම් දෙන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0652/'08

ගරු එම්. ඩී. නාමල් කරුණාරත්න මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) කුරුණෑගල දිස්ත්‍රික්කයේ පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මඩහපොළ, මැදකන්ද හා පරගහඇල කඳු ආශ්‍රිත ප්‍රදේශයේ රජයේ ඉඩම් හා පෞද්ගලික ඉඩම් පිළිබඳ සවිස්තර වාර්තාවක් සහ මඩහපොළ, මැදකන්ද හා පරගහඇල ග්‍රාම නිලධාරි වසම්වල පදිංචි ගොවීන්ගේ ඉඩම්වල හිමිකම පිළිබඳ නෛතික තත්වය කවරේද යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) මඩහපොළ හා මැදකන්ද ග්‍රාම නිලධාරි වසම්වල ඉඩම් අක්කර 50ක අයිතියක් ඇතැයි පවසමින් යම් අයෙකු විසින් එකී ඉඩම්වල පදිංචිකරුවන් ඉවත් කිරීමට කටයුතු කරන බව එතුමා දන්නෙහිද?

(ඇ) (i) ඒ ආකාර වූ පෞද්ගලික ඉඩමක් එම ග්‍රාම නිලධාරි වසම්වල පිහිටා තිබේද;

(ii) එසේ නම්, එම ඉඩම් ප්‍රමාණය සහ එහි ස්වභාවය කවරේද;

(iii) එම ඉඩමේ පළමු අයිතිකරුගේ සිට වත්මන් අයිතිකරු දක්වා වූ පෙළපත් සටහන කවරේද;

(iv) යම් පෞද්ගලික ඉඩම් හිමියෙක් විසින් එම ග්‍රාම නිලධාරී වසම්වල පදිංචිකරුවන් ඉවත් කිරීමට පියවර ගන්නේ නම්, ඔවුන් සඳහා විකල්ප ඉඩම් ලබා දෙන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0775/'08

ගරු ජේමසිරි මානගේ මහතා,— ධීවර හා ජලජ සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) 2008.07.22 වැනි දින රාත්‍රී දකුණු හා බටහිර මුහුදු කලාපයේ ඇති වූ සුළිසුළං තත්වයෙන් ධීවරයින් අනතුරට පත්වූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම සුළිසුළං තත්වයෙන් මියගිය හා අතුරුදහන් වූ ධීවරයින් සංඛ්‍යාව කොපමණද;

(ii) එම අයගේ නම් හා ලිපිනයන් කවරේද;

(iii) අනතුරට පත් ධීවර යාත්‍රා සංඛ්‍යාව කොපමණද;

(iv) එම යාත්‍රාවල හිමිකරුවන්ගේ නම් හා ලිපිනයන් කවරේද;

(v) අතුරුදහන් වූ සහ මරණයට පත්වූ අයගේ පවුල්වලට ලබාදුන් සහන කවරේද;

(vi) හානියට පත් ධීවර යාත්‍රා සහ ආම්පන්න යථා තත්වයට පත්කර ගැනීමට දී තිබෙන සහන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0776/'08

ගරු ජේමසිරි මානගේ මහතා,— ධීවර හා ජලජ සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දෙවිනුවර දකුණ ග්‍රාම නිලධාරි වසමේ මුහුදට ඉතාම සමීපව ඉදිකර තිබෙන "ලයිට් හවුස්" හෝටලයේ හිමිකරුගේ නම හා ලිපිනය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙම හෝටලය ස්ථානගත කිරීමේදී වෙරළ සංරක්ෂණ පනතේ විධිවිධාන උල්ලංඝණය කර තිබෙන බව එතුමා දන්නෙහිද?

(ඇ) (i) මුහුදු වෙරළේ යම් ඉදිකිරීමක් කරන්නේ නම්, ඒ සඳහා බලපත්‍රයක් ලබාගත යුත්තේ කවර දෙපාර්තමේන්තුවකින්ද;

(ii) ඒ අනුව ඉහත ඉදිකිරීම සඳහා බලපත්‍රයක් ලබාදී තිබේද;

(iii) එවකට අදාළ අමාත්‍යධුරය දැරුවේ කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) ඉහත ඉදිකිරීම නීති විරෝධි බව එතුමා පිළිගන්නෙහිද?

(ඉ) එසේ නම්, මේ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ගය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඊ) නොඑසේ නම්, ඒ මන්ද?

0777/'08

ගරු ජේමසිරි මානගේ මහතා,— ධීවර හා ජලජ සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) අප රටේ මිරිදිය ධීවර කර්මාන්තය සිදු කරන ජලාශ සංඛ්‍යාව කොපමණද;

(ii) එම ධීවර වෘත්තියේ යෙදී සිටින ධීවරයින් සංඛ්‍යාව හා පවුල් සංඛ්‍යාව කොපමණද;

(iii) මිරිදිය ධීවර කර්මාන්තයේ යොදා තිබෙන ධීවර යාත්‍රා සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මිරිදිය ධීවර කර්මාන්තයේ ප්‍රවර්ධනය සඳහා රජය ගෙන තිබෙන පියවර කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0738/'08

ගරු තිලකරත්න විතානාච්චි මහතා,— කර්මාන්ත සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 'එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට එක් කර්මාන්ත ගම්මානයක්' යන "මහින්ද චින්තන" වැඩ පිළිවෙළ යටතේ ගාල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 19 සඳහා කර්මාන්ත කොපමණ සංඛ්‍යාවක් මේ වනවිට ආරම්භ කර තිබේද;

(ii) එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස නම් වශයෙන් පිළිවෙළින් කවරේද;

(iii) ආරම්භ කර තිබෙන කර්මාන්ත ශාලාවල අදාළ නිෂ්පාදන කවරේද;

(iv) එම කර්මාන්ත හිමියන්ගේ නම් හා ලිපිනයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) එක් එක් කර්මාන්තය සඳහා "මහින්ද චින්තන" වැඩ පිළිවෙල යටතේ කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශයෙන් කොපමණ මුදලක් වෙන් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම එක් එක් කර්මාන්තය සඳහා කර්මාන්ත හිමියන් කොපමණ මුදලක් ආයෝජනය කර තිබේද;

(ii) දේශීය ආයෝජකයින්ට අමතරව විදේශ ආයෝජකයින් සිටීද;

(iii) එසේ නම්, ඒ කවර කර්මාන්ත සඳහාද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) 2008 වර්ෂය වනවිට කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශයේ ලියාපදිංචි ඇති ගාල්ල දිස්ත්‍රික්කයේ දැනට ක්‍රියාත්මකව තිබෙන මධ්‍යම ප්‍රමාණයේ කර්මාන්ත කවරේද යන්න විස්තරාත්මකව එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0742/'08

ගරු තිලකරත්න විතානාච්චි මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ගාල්ල දිස්ත්‍රික්කයේ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ (ශ්‍රී ලංගම) උඩුගම ඩිපෝවට අයත් බස් රථ සංඛ්‍යාව කොපමණද;

(ii) එම බස් රථ අතුරින් ධාවනයට සුදුසු සංඛ්‍යාව කොපමණද;

(iii) සුලු අලුත්වැඩියාවන්ගෙන් පසුව ධාවනය කළ හැකි බස්රථ සංඛ්‍යාව කොපමණද;

(iv) ධාවනයට යොදාගත නොහැකි බස් රථ සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙම ඩිපෝවේ ඩිපෝ අධිකාරිවරයාගේ සිට සාමාන්‍ය සේවකයා දක්වා කොපමණ කාර්ය මණ්ඩලයක් සිටීද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) රියදුරන්, කොන්දොස්තරවරුන් සහ රාත්‍රී වැඩමුරයේ යෙදෙන කාර්මික නිලධාරීන් සඳහා අවශ්‍ය නේවාසික පහසුකම් ඉතාම අසතුටුදායක මට්ටමක තිබෙන බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) සියලුම සේවක මහත්ම මහත්මීන් සඳහා අවශ්‍ය පිරිසිදු පානීය ජලය තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) ඔවුන්ට අවශ්‍ය ආපනශාලා පහසුකම් ක්‍රමවත්ව නොමැති බව එතුමා පිළිගන්නෙහිද?

(ඊ) ඉතා දීර්ඝ කාලයක් තිස්සේ අවම පහසුකම් සහිතව ඉතා ඉහල සේවාවක් සපයන මෙම ඩිපෝවේ සේවක මහත්ම මහත්මීන් සඳහා ඉහත සඳහන් කරන ලද අඩු පහසුකම් සම්පූර්ණ කිරීම කොපමණ කාල සීමාවක් තුළ සිදු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(උ) නොඑසේ නම්, ඒ මන්ද?

0744/'08

ගරු තිලකරත්න විතානාච්චි මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) 2005 වර්ෂය වනවිට කොපමණ මාර්ග සංඛ්‍යාවකට ගා/උඩුගම ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩල (ශ්‍රී ලංගම) ඩිපෝවට අයත් බස් රථ ධාවනය කරන මාර්ග බලපත්‍ර (කාල සටහන්) තිබුණේද යන්න විස්තරාත්මකව එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම පැරණි කාල සටහන් අනුව 2008 ජුලි මස වනවිට කොපමණ මාර්ග සංඛ්‍යාවක බස් රථ ධාවනය කරන්නේද;

(ii) පැරණි කාල සටහන් අනුව කොපමණ මාර්ග සංඛ්‍යාවක බස් රථ ධාවනය කිරීම මේ වනවිට නවතා තිබේද;

(iii) ඒ සඳහා බලපා ඇති හේතු කවරේද

(iv) කොළඹ බලා ධාවනය කරන ලද ගමන් වාර සංඛ්‍යාව අඩුකර තිබේද;

(v) උඩුගම - මණ්ඩලපුර, නෙලුව, වාරුකන්දෙනිය සහ තවලම, හල්විටිගල ජනපදය දක්වා ගමන් කරමින් තිබූ බස් රථ නියමිත පරිදි ධාවනය වන්නේද;

(vi) පාසල් ළමුන්ට ගමන් කළ හැකි ලෙස සකස් කර තිබුණු, උඩුගම ඩිපෝවෙන් ධාවනය වන, ගමන් වාර අඩු කිරීමකින් තොරව ධාවනය වන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ඉතාම කාර්යක්ෂම ඩිපෝවක් ලෙස තිබූ උඩුගම ඩිපෝවේ බස්රථ ගමන්වාර පාසල් සිසුන්ට සහ ජනතාවට පහසුවන අයුරින් සංශෝධනය කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0603/'08

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) කෘෂි නිෂ්පාදන අලෙවි අධිකාරිය නමින් ආයතනයක් ස්ථාපිත කර තිබේද;

(ii) එසේ නම්, එය කවර දිස්ත්‍රික්ක තුළ ක්‍රියාත්මක වන්නේද;

(iii) මෙම අධිකාරිය මගින් කවර නිෂ්පාදන මිලදී ගන්නේද;

(iv) මිලදී ගන්නා ඒ ඒ නිෂ්පාදන වර්ගය සඳහා කොපමණ මුදලක් වෙන් කළේද;

(v) වැය කළ මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අදාළ අධිකාරිය මගින් ඒ ඒ වර්ෂය තුළ මිලදී ගත් වී ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එක් එක් වර්ගයේ වී කොපමණ ප්‍රමාණයක් කවර මිලකට ලබා ගත්තේද;

(iii) ඒවා මිල දී ගත්තේ කවර අරමුණු සඳහාද;

(iv) ඒසේ මිල දී ගත් වී කවර කටයුත්තක් සඳහා ප්‍රයෝජනයට ගත්තේද;

(v) ඒවා පෞද්ගලික ගැනුම්කරුවන්ට අලෙවි කළේද;

(vi) එසේ නම්, ගැණුම්කරුවන්ගේ නම්, ලිපිනයන්, මිලදී ගත්වී ප්‍රමාණය, වී වර්ගය, වී කිලෝ එකක මිල හා අලෙවි කළ දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0606/'08

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) විශේෂ ව්‍යාපෘති අමාත්‍යාංශය සඳහා 2007 අංක 01 දරන පරිපූරක ඇස්තමේන්තුව මගින් මුදල් වෙන්කර ගත් බව එතුමා දන්නෙහිද?

(ආ) (i) පුනරාවර්තන වියදම් සඳහා වෙන්වූ රු. 37,500,000/- ක මුදල කෙදිනක සිට වැය කිරීම අරඹන ලද්දේද;

(ii) 2007 දෙසැම්බර් මස 31 වැනි දිනට වැය කර ඇති මුදල කොපමණද;

(iii) පුනරාවර්තන වියදම් යොදවා මිල දී ගැනීම් සිදුකර තිබේද;

(iv) එසේ නම්, කවර ද්‍රව්‍ය කවර මිල ගණන් යටතේද;

(v) මූලධන වියදම් සඳහා වූ රු. 10,800,000/- ක ප්‍රතිපාදනයෙන් ඒ ඒ ව්‍යාපෘති සඳහා වෙන්කළ මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) එම මුදලින් කොපමණ ප්‍රමාණයක් වැයකර තිබේද;

(vii) එක් එක් ව්‍යාපෘතිය සඳහා වෙන්කරන ලද මුදල සහ වැයකරන ලද මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

**(2009 ජනවාරි මස 21 වැනි බදාදා)**

0955/'08

ගරු චන්ද්‍රසේන විජේසිංහ මහතා,— තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) ඒකාබද්ධ තැපැල් සේවයේ "අ" කාණ්ඩයේ 3 ශ්‍රේණියේ "ආ" ඛණ්ඩයේ තනතුරුවලට උසස් කිරීමේ සම්මුඛ පරීක්ෂණය 2005.10.12 සහ 2005.10.13 දිනයන්හි තැපැල් මූලස්ථානයේ පැවති බව එතුමා දන්නෙහිද?

(ආ) එම සම්මුඛ පරීක්ෂණයට සහභාගි වූ ඒකාබද්ධ තැපැල් සේවයේ "අ" කාණ්ඩයේ 3 ශ්‍රේණියේ "ආ" කණ්ඩයේ ප්‍රධාන තැපැල් ස්ථානාධිපති, පාලන සහකාර, තැපැල් කාර්යාල විමර්ශන පරීක්ෂක හා තැපැල් කාර්යාල ගිණුම් පරීක්ෂකවරුන්ගේ නම් සහ රාජකාරි ලිපිනයන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) මෙම සම්මුඛ පරීක්ෂණයේදී නිලධාරියාගේ ජ්‍යෙෂ්ඨත්වය, සේවා වාර්තාව හා සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාව/පෞරුෂත්වය යටතේ මොවුන් ලබාගත් ලකුණු එක් එක් නිලධාරියාට අදාළව වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0902/'08

ගරු අජිත් කුමාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ගාල්ල දිස්ත්‍රික්කයේ ඇල්පිටිය අධ්‍යාපන කලාපයට අයත් දැනට ක්‍රියාත්මක පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා එක් එක් අධ්‍යාපන කොට්ඨාස අනුව නම් වශයෙන් කවරේද;

(iii) ඉහත එක් එක් පාසලට අවශ්‍ය ගුරුවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම එක් එක් පාසලේ දැනට සේවය කරන ගුරුවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත අධ්‍යාපන කලාපයට අයත්ව තිබූ වසා දමා ඇති පාසල් සංඛ්‍යාව අධ්‍යාපන කොට්ඨාශ මට්ටමින් කොපමණද;

(ii) එම පාසල් වසා දමන ලද්දේ කවර වර්ෂයේද;

(iii) අදාළ පාසල් වසා දැමීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) කවර හෝ හේතුවක් නිසා වසා දැමීමට නියමිත වූ පාසල් වසා දැමීමේ අනතුරින් වළක්වා ගැනීමට අවශ්‍ය භෞතික සම්පත්, මානව සම්පත් හා අනෙකුත් පහසුකම් ලබාදීමට සහ පාසල් වසා දැමීම වැළැක්වීමට අවශ්‍ය අනෙකුත් ක්‍රියාමාර්ග ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0903/'08

ගරු අජිත් කුමාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ගාල්ල දිස්ත්‍රික්කයේ අම්බලන්ගොඩ අධ්‍යාපන කලාපයට අයත් දැනට ක්‍රියාත්මක පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා එක් එක් අධ්‍යාපන කොට්ඨාස අනුව නම් වශයෙන් කවරේද;

(iii) ඉහත එක් එක් පාසලට අවශ්‍ය ගුරුවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම එක් එක් පාසලේ දැනට සේවය කරන ගුරුවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත අධ්‍යාපන කලාපයට අයත්ව තිබූ වසා දමා ඇති පාසල් සංඛ්‍යාව අධ්‍යාපන කොට්ඨාශ මට්ටමින් කොපමණද;

(ii) එම පාසල් වසා දමන ලද්දේ කවර වර්ෂයේද;

(iii) අදාළ පාසල් වසා දැමීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) කවර හෝ හේතුවක් නිසා වසා දැමීමට නියමිත වූ පාසල් වසා දැමීමේ අනතුරින් වළක්වා ගැනීමට අවශ්‍ය භෞතික සම්පත්, මානව සම්පත් හා අනෙකුත් පහසුකම් ලබාදීමට සහ පාසල් වසා දැමීම වැළැක්වීමට අවශ්‍ය අනෙකුත් ක්‍රියාමාර්ග ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2009 ජනවාරි මස 22 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0720/'08

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) භාණ්ඩාගාරය විසින් සීමාසහිත හොටෙල් ඩිවෙලපර්ස් (ලංකා) සමාගමට (හිල්ටන් හෝටලයට) ලබා දී ඇති ණය ප්‍රමාණය කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එක් එක් ණය මුදල සම්බන්ධයෙන් වන භාණ්ඩාගාර ලේඛන සභාගත කරමින්,

(i) ණය මුදලේ ප්‍රමාණය හා එය ලබාදුන් දිනය කවරේද;

(ii) පොලී අනුපාතයන් හා නැවත ගෙවීමේ කොන්දේසි කවරේද;

(iii) ප්‍රාග්ධනය නැවත ගෙවීමේ කොන්දේසි කවරේද ;

(iv) අද දින වන විට උපචිත පොලී ප්‍රමාණය කොපමණද;

(v) අද දින වන විට ගෙවීමට ඇති මුළු පොලී ප්‍රමාණය හා ගෙවීමට ඇති මුළු ප්‍රාග්ධන ප්‍රමාණය කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත සඳහන් කර ඇති ණය මුදල්වල ගෙවීම පැහැර හරින ලද ණය මුදල්ද ඇතුළත්වී තිබේද;

(ii) 2008 වර්ෂය තුළ ලබා දෙන ලද ණය මුදල්වල ප්‍රමාණය, ඒවා ලබා දුන් දිනය හා ඒවායේ කොන්දේසි කවරේද;

(iii) භාණ්ඩාගාරය විසින් උක්ත ණය මුදල් හා පොලිය අයකර ගනු ලබන්නේ කෙසේද;

(iv) හෝටලය ඉදිකිරීමේ මූලික සැලසුම් පිරිවැය හා තථ්‍ය පිරිවැය කොපමණද;

(v) අද වන විට හෝටලයේ ශුද්ධ වටිනාකම කොපමණද; සහ

(vi) හෝටලයට අයත් මුළු භූමි ප්‍රමාණය කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0721/'08

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) අයවැය සම්මත වීමෙන් පසුව ජාතික අයවැය දෙපාර්තමේන්තුව, වැය ශීර්ෂ 801 සහ 240 යටතේ සිදුකරන ලද සියලු වියදම් එතුමා මෙම සභාවට වෙන්වෙන් වශයෙන් ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) මෙම වියදම් පිළිබඳව පාර්ලිමේන්තුවට දැනුම් දුන් දිනය සහ දැනුම් දුන් ආකාරය කවරේද;

(ii) සමුච්චිත වශයෙන් රු. මිලියන 150 ඉක්මවා ගොස් ඇති, ඉහත (අ) අනුව සිදුකරන ලද සියලු වියදම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0735/'08

ගරු ජේමසිරි මානගේ මහතා,— පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ශ්‍රී ලංකාවේ තේක්ක වන වගාව පැතිර ඇති හෙක්ටයාර ප්‍රමාණය කොපමණද;

(ii) ඒ කවර ප්‍රදේශවලද;

(iii) පසුගිය දස වසර තුළ, මොණරාගල සහ හම්බන්තොට යන දිස්ත්‍රික්කවල තේක්ක වන වගාවේ තේක්ක ගස් අලෙවියෙන් ලද ආදායම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඉහත කාල සීමාව තුළ කටයුතු කළ අදාළ විෂයභාර අමාත්‍යවරුන්ගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0862/'08

ගරු ජේමසිරි මානගේ මහතා,— ධීවර හා ජලජ සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) ලංකාවේ උතුරු මුහුදු කලාපයේ අප රටට අයත් මුහුදු සීමාව වෙරළේ සිට කොපමණ දුරකින් පිහිටා තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) උතුරේ මුහුදු සීමාව සම්බන්ධයෙන් "සාර්ක්" සමුළුවේ දී කවර හෝ තීරණයක් ගනු ලැබුවේද;

(ii) එසේ නම්, ගනු ලැබූ තීරණ කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) ඉන්දීය ධීවරයින් ලංකාවට අයත් මුහුදු සීමාවේ මසුන් මැරීම සම්බන්ධයෙන් මේ වනවිට ගෙන තිබෙන ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0885/'08

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමාගෙන් ඇසීමට ,—

(අ) (i) පිළියන්දල නාම්පමුණුවේ ඉදි කරන ලද ඩයලොග් සන්නිවේදන කුලුන පිහිටා ඇත්තේ ජනාවාස බහුල ප්‍රදේශයක බවත්;

(ii) 2008.06.29 දින හෝ ආසන්න දිනයක රාත්‍රියේ අකුණු සැර වැදීම නිසා කුලුන ආසන්න ප්‍රදේශයේ නිවාසවල විද්‍යුත් පරිපථ, ගෘහ විදුලි උපකරණ හා දුරකථනවලට දැඩි අලාභහානි සිදුවී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව හා ඩයලොග් ආයතනය ඇතුළු වගකිවයුතු ආයතන වෙත මෙම සිද්ධිය පිළිබඳව ප්‍රදේශවාසීන්ගේ අත්සනින් යුත් පෙත්සම් යොමුකර ඇති බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) මෙම දුරකථන සන්නිවේදන කුලුන ඉදිකිරීම සඳහා අනුමතිය ලබාදීමේදී සලකා බලන ලද කරුණු කවරේද;

(ii) ඒ සඳහා අනුමතිය ලබාගත යුතු ආයතන කවරේද;

(iii) අදාල දුරකථන කුලුන ඉදිකිරීමට එකී ආයතන මගින් අනුමතිය ලබාදී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) එම නිවාසවල උපකරණවලට සිදුවී ඇති අලාභහානි වෙනුවෙන් වන්දි මුදල් ගෙවීමට එතුමා අවශ්‍ය පියවර ගන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0893/'08

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) බොල්ගොඩ ගඟේ ගඟ රක්ෂිතය අයත් වන්නාවූ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කවරේද;

(ii) ගඟ රක්ෂිතයට අදාළ මැණුම් සිතියම් එම ප්‍රාදේශීය ලේකම් කාර්යාල සතුව තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මැණුම් සිතියම්වල දක්වා ඇති ගඟ රක්ෂිත ප්‍රදේශ බොහොමයක් පෞද්ගලික අයිතියට ගෙන ඇති බවත්;

(ii) ඒවායේ ගොඩනැගිලිද ඉදිකර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) බොල්ගොඩ ගඟ හා ගඟ රක්ෂිතයේ ඉතිරිව ඇති ස්ථාන ආරක්ෂා කර ගැනීමට ගන්නා පියවර කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0898/'08

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියක් සඳහා බුලත්කොහුපිටිය ප්‍රාදේශීය සභාව විසින් බුලත්කොහුපිටිය, වැගල්ල, උඩභවත්ත පදිංචි එච්. පී. දයානන්ද මහතාට අයත් අක්කර 4 ක පමණ ඉඩම මිලදී ගෙන තිබේද;

(ii) එසේ නම්, එම මිලදී ගැනීමට අදාළව ඉඩම් අත්පත් කරගැනීමේ නෛතික පටිපාටිය අනුගමනය කර තිබේද;

(iii) ඉඩමේ වටිනාකම තක්සේරු කරන ලද්දේ කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) බුලත්කොහුපිටිය ප්‍රාදේශීය ලේකම් පී. සී. ඩී. සිගේරා මහතා විසින් මෙම ඉඩමේ ඇති ගස් ඉවත්කර ගැනීම සඳහා දයානන්ද මහතාට අංක /බුල/5/6/43 යටතේ බලපත්‍රයක් නිකුත්කර තිබෙන බවත්;

(ii) අදාළ ප්‍රාදේශීය සභා සභාපතිවරයාගේ බලපෑම යටතේ පොලිස් නිලධාරීන් විසින් එම ගස්කැපීම නතර කර ඇති බවත්;

(iii) මෙම ගැටලුව පිළිබඳව පළාත් ප්‍රධාන අමාත්‍යතුමාට, පළාත් පාලන කොමසාරිස්වරයාට, අතිගරු ජනාධිපතිතුමාට, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාට සහ පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයාට ලිඛිතව පැමිණිලි කළද සාධාරණ විසඳුමක් නොලද බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) මෙම ඉඩම මිලදී ගැනීමේදී ඇතිවූ එකඟතාවය අනුව විකුණුම්කාර දයානන්ද මහතාට ඉඩමේ ගස් ඉවත්කර ගැනීමට හෝ ඔහුට සිදුවූ අසාධාරණයට විසඳුමක් හෝ ලබාදීමට එතුමා පියවර ගන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0904/'08

ගරු අජිත් කුමාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ගාල්ල දිස්ත්‍රික්කයේ ගාල්ල අධ්‍යාපන කලාපයට අයත් දැනට ක්‍රියාත්මක පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා එක් එක් අධ්‍යාපන කොට්ඨාස අනුව නම් වශයෙන් කවරේද;

(iii) ඉහත එක් එක් පාසලට අවශ්‍ය ගුරුවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම එක් එක් පාසලේ දැනට සේවය කරන ගුරුවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත අධ්‍යාපන කලාපයට අයත්ව තිබූ වසා දමා ඇති පාසල් සංඛ්‍යාව අධ්‍යාපන කොට්ඨාශ මට්ටමින් කොපමණද;

(ii) එම පාසල් වසා දමන ලද්දේ කවර වර්ෂයේද;

(iii) අදාළ පාසල් වසා දැමීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) කවර හෝ හේතුවක් නිසා වසා දැමීමට නියමිත වූ පාසල් වසා දැමීමේ අනතුරින් වළක්වා ගැනීමට අවශ්‍ය භෞතික සම්පත්, මානව සම්පත් හා අනෙකුත් පහසුකම් ලබාදීමට සහ පාසල් වසා දැමීම වැළැක්වීමට අවශ්‍ය අනෙකුත් ක්‍රියාමාර්ග ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0905/'08

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) මීගමුව - කුරුණෑගල මාර්ගයේ සහ පන්නල - කුලියාපිටිය මාර්ගයේ පස්වරු 7.00 න් පසුව පෞද්ගලික බස්රථ හෝ ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලයට අයත් බස්රථ ධාවනය නොවන බවත්;

(ii) රැකීරක්ෂා සඳහා ගොස් පස්වරු 7.00 න් පසු ආපසු නිවෙස් වෙත පැමිණෙන විශාල පිරිසක් මේ හේතුවෙන් අපහසුතාවයට පත්වන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මීගමුව - කුරුණෑගල මාර්ගයේ සහ පන්නල - කුලියාපිටිය මාර්ගයේ පස්වරු 7.00 සිට පස්වරු 11.00 දක්වා බස්රථ ධාවනය කිරීමට එතුමා අවශ්‍ය පියවර ගන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

913/'08

ගරු සුජාතා අලහකෝන් මහත්මිය,— සංස්කෘතික කටයුතු හා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) මාතලේ සංස්කෘතික මධ්‍යස්ථානය හා එම භූමිය මාතලේ ප්‍රාදේශීය ලේකම් විසින් සංස්කෘතික කටයුතු හා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශයට විධිමත්ව පවරා තිබේද;

(ii) එලෙස පවරා දී තිබේ නම්, එම ඉඩමේ ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සංස්කෘතික මධ්‍යස්ථානයේ ඉඩ පහසුකම් ප්‍රමාණවත් නොවන බැවින් දෙවන අදියර වශයෙන් ශාලාව ඉදිකිරීමට අදාළ වාස්තු විද්‍යාත්මක සැලැස්ම හා ඇස්තමේන්තුව සකස් කළ බවත්;

(ii) සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් 2006 වර්ෂයේදී ඒ සඳහා මුල්ගල තැබූ බවත්;

(iii) මේ වනතෙක් එය මුල්ගලට පමණක් සීමාවී තිබෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ඈ) (i) එම ශාලාව ඉදිකිරීමට ඇති බාධා කවරේද;

(ii) එම බාධා ඉවත්කර ශාලාව ඉදිකිරීමට අවශ්‍ය පියවර ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2009 ජනවාරි මස 23 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0874/'08

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ ඇති මැතිවරණ කොට්ඨාස සංඛ්‍යාව එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2004 අප්‍රේල් 01 වැනි දින සිට මේ දක්වා කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ බලපත්‍ර නිකුත් කර අලුතින් විවෘත කරන ලද මත්පැන් අලෙවිසැල්, විදේශීය මත්පැන් අලෙවිසැල්, අවන්හල් සහ හෝටල් සංඛ්‍යාව කොපමණද;

(ii) මැතිවරණ කොට්ඨාස මට්ටමින් ඒවායේ නම් සහ 2004 සිට 2007 දක්වා සෑම වර්ෂයකම අවසානයේදී සහ මේ දක්වා මෙම නව මත්පැන් අලෙවිසැල්වලින් උපයන ලද ආදායම කවරේද;

(iii) 1998 සිට 2003 දක්වා සෑම වර්ෂයකම දෙසැම්බර් 31 වැනි දිනට ඉහත (i) ට අදාළ තොරතුරු සහ කුරුණෑගල දිස්ත්‍රික්කය සඳහා මුළු ආදායම කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0058/'08

ගරු රවි කරුණානායක මහතා,— අපනයන සංවර්ධන හා ජාත්‍යන්තර වෙළෙඳ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) පසුගිය වර්ෂ තුන තුළ අපනයන සංවර්ධන හා ජාත්‍යන්තර වෙළෙඳ කටයුතු අමාත්‍යතුමා විසින් කරන ලද විදේශ සංචාර සංඛ්‍යාව කොපමණද;

(ii) සංචාරය කරන ලද රටවල් කවරේද; සහ

(iii) ප්‍රවේශ පත්‍ර සඳහා වියදම් සහ හෝටල් ගාස්තු වෙන් වෙන් වශයෙන් සඳහන් කරමින් ඉහත සඳහන් එක් එක් සංචාරයේ වියදම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම සංචාරවලදී කැටුව යන ලද පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම් සහ ඔවුන් සඳහා දැරීමට සිදු වූ වියදම් වෙන් වෙන් වශයෙන් කොපමණද; සහ

(iii) ඉහත සඳහන් එක් එක් විදේශ සංචාරය සඳහා හේතුව කුමක්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මේ සඳහා අයවැයෙන් වෙන් කරන ලද දීමනාව කොපමණද; සහ

(ii) එවැනි සංචාර සඳහා සපයනු ලැබූ පරිපූරක වැය ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0084/'08

ගරු රවි කරුණානායක මහතා,— වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යතුමා සහ වරාය සහ ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) මිහින් එයාර් සමාගම සංස්ථාගත කළ දිනය කවරේද;

(ii) එම සමාගමේ ප්‍රථම වාණිජ ගුවන් ගමන සිදු කළ දිනය කවරේද;

(iii) මිහින් එයාර් සමාගම ආරම්භයේ සිට අද දක්වා සිටි එම සමාගමේ අධ්‍යක්ෂවරුන්ගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත සඳහන් එක් එක් පුද්ගලයාට එක් එක් වසර තුළ දී ගෙවන ලද වැටුප්, මිහින් එයාර් ගුවන් සේවයෙහි භාවිතා කළ ප්‍රවේශපත්‍ර, අනෙකුත් ගුවන් සේවා වෙත ප්‍රවේශපත්‍ර සඳහා කරන ලද ගෙවීම් සහ ලබා දුන් අනිකුත් වරප්‍රසාද කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ලබා දී ඇති හා ලබා දීමට නියමිත වෙනත් ප්‍රතිලාභ කවරේද;

(ii) මෙම සමාගම ක්‍රියාත්මක වූ දින සිට මාසිකව එය ලැබූ සමස්ත ශුද්ධ ලාභය හා දළ ලාභය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0896/'08

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— වෙළෙඳ, අලෙවි සංවර්ධන, සමූපකාර හා පාරිභෝගික සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) වැලිකඩ රාජගිරියේ පවත්වාගෙන ගිය "ලක් සතොස" (බජට් ෂොප්) ආයතන ගොඩනැගිල්ලේ හා ඉඩමේ අයිතිකරුවන් කවුරුන්ද;

(ii) බජට් ෂොප් ආයතනයේ අයිතිය තිබුණේ කවුරුන් වෙතද;

(iii) මේ මොහොත වන විට එම ගොඩනැගිල්ලේ හා ඉඩමේ අයිතිය ඇත්තේ කවුරුන් වෙතද;

(iv) බජට් ෂොප් ආයතනය පවත්වාගෙන ගිය ගොඩනැගිල්ල හා ඉඩම, ආයතනය වසා දැමීමේ දී අහිමි වීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙම භූමිය තුළ බජට් ෂොප් ආයතනය විවෘත කිරීමේ දී එහි අයිතිය පිළිබඳ ගිවිසුමකට අදාළ අමාත්‍යාංශය මැදිහත් වූයේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

## (2009 ජනවාරි මස 23 වැනි සිකුරාදා)

0875/'08

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) ගාල්ල දිස්ත්‍රික්කය තුළ ඇති මැතිවරණ කොට්ඨාස සංඛ්‍යාව එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2004 අප්‍රේල් 01 වැනි දින සිට මේ දක්වා ගාල්ල දිස්ත්‍රික්කය තුළ බලපත්‍ර නිකුත් කර අලුතින් විවෘත කරන ලද මත්පැන් අලෙවිසැල්, විදේශීය මත්පැන් අලෙවිසැල්, අවන්හල් සහ හෝටල් සංඛ්‍යාව කොපමණද;

(ii) මැතිවරණ කොට්ඨාස මට්ටමින් ඒවායේ නම් සහ 2004 සිට 2007 දක්වා සෑම වර්ෂයකම අවසානයේදී සහ මේ දක්වා මෙම නව මත්පැන් අලෙවිසැල්වලින් උපයන ලද ආදායම කවරේද;

(iii) 1998 සිට 2003 දක්වා සෑම වර්ෂයකම දෙසැම්බර් 31 වැනි දිනට ඉහත (i) ට අදාළ තොරතුරු සහ ගාල්ල දිස්ත්‍රික්කය සඳහා මුළු ආදායම කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0876/'08

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) මාතර දිස්ත්‍රික්කය තුළ ඇති මැතිවරණ කොට්ඨාස සංඛ්‍යාව එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2004 අප්‍රේල් 01 වැනි දින සිට මේ දක්වා මාතර දිස්ත්‍රික්කය තුළ බලපත්‍ර නිකුත් කර අලුතින් විවෘත කරන ලද මත්පැන් අලෙවිසැල්, විදේශීය මත්පැන් අලෙවිසැල්, අවන්හල් සහ හෝටල් සංඛ්‍යාව කොපමණද;

(ii) මැතිවරණ කොට්ඨාස මට්ටමින් ඒවායේ නම් සහ 2004 සිට 2007 දක්වා සෑම වර්ෂයකම අවසානයේදී සහ මේ දක්වා මෙම නව මත්පැන් අලෙවිසැල්වලින් උපයන ලද ආදායම කවරේද;

(iii) 1998 සිට 2003 දක්වා සෑම වර්ෂයකම දෙසැම්බර් 31 වැනි දිනට ඉහත (i) ට අදාළ තොරතුරු සහ මාතර දිස්ත්‍රික්කය සඳහා මුළු ආදායම කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0877/'08

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ ඇති මැතිවරණ කොට්ඨාස සංඛ්‍යාව එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2004 අප්‍රේල් 01 වැනි දින සිට මේ දක්වා හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ බලපත්‍ර නිකුත් කර අලුතින් විවෘත කරන ලද මත්පැන් අලෙවිසැල්, විදේශීය මත්පැන් අලෙවිසැල්, අවන්හල් සහ හෝටල් සංඛ්‍යාව කොපමණද;

(ii) මැතිවරණ කොට්ඨාස මට්ටමින් ඒවායේ නම් සහ 2004 සිට 2007 දක්වා සෑම වර්ෂයකම අවසානයේදී සහ මේ දක්වා මෙම නව මත්පැන් අලෙවිසැල්වලින් උපයන ලද ආදායම කවරේද;

(iii) 1998 සිට 2003 දක්වා සෑම වර්ෂයකම දෙසැම්බර් 31 වැනි දිනට ඉහත (i) ට අදාළ තොරතුරු සහ හම්බන්තොට දිස්ත්‍රික්කය සඳහා මුලු ආදායම කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0878/'08

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) පොලොන්නරුව දිස්ත්‍රික්කය තුළ ඇති මැතිවරණ කොට්ඨාස සංඛ්‍යාව එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2004 අප්‍රේල් 01 වැනි දින සිට මේ දක්වා පොලොන්නරුව දිස්ත්‍රික්කය තුළ බලපත්‍ර නිකුත් කර අලුතින් විවෘත කරන ලද මත්පැන් අලෙවිසැල්, විදේශීය මත්පැන් අලෙවිසැල්, අවන්හල් සහ හෝටල් සංඛ්‍යාව කොපමණද;

(ii) මැතිවරණ කොට්ඨාස මට්ටමින් ඒවායේ නම් සහ 2004 සිට 2007 දක්වා සෑම වර්ෂයකම අවසානයේදී සහ මේ දක්වා මෙම නව මත්පැන් අලෙවිසැල්වලින් උපයන ලද ආදායම කවරේද;

(iii) 1998 සිට 2003 දක්වා සෑම වර්ෂයකම දෙසැම්බර් 31 වැනි දිනට ඉහත (i) ට අදාළ තොරතුරු සහ පොලොන්නරුව දිස්ත්‍රික්කය සඳහා මුලු ආදායම කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0879/'08

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) අනුරාධපුරය දිස්ත්‍රික්කය තුළ ඇති මැතිවරණ කොට්ඨාස සංඛ්‍යාව එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2004 අප්‍රේල් 01 වැනි දින සිට මේ දක්වා අනුරාධපුරය දිස්ත්‍රික්කය තුළ බලපත්‍ර නිකුත් කර අලුතින් විවෘත කරන ලද මත්පැන් අලෙවිසැල්, විදේශීය මත්පැන් අලෙවිසැල්, අවන්හල් සහ හෝටල් සංඛ්‍යාව කොපමණද;

(ii) මැතිවරණ කොට්ඨාස මට්ටමින් ඒවායේ නම් සහ 2004 සිට 2007 දක්වා සෑම වර්ෂයකම අවසානයේදී සහ මේ දක්වා මෙම නව මත්පැන් අලෙවිසැල්වලින් උපයන ලද ආදායම කවරේද;

(iii) 1998 සිට 2003 දක්වා සෑම වර්ෂයකම දෙසැම්බර් 31 වැනි දිනට ඉහත (i) ට අදාළ තොරතුරු සහ අනුරාධපුරය දිස්ත්‍රික්කය සඳහා මුලු ආදායම කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0880/'08

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) කළුතර දිස්ත්‍රික්කය තුළ ඇති මැතිවරණ කොට්ඨාස සංඛ්‍යාව එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2004 අප්‍රේල් 01 වැනි දින සිට මේ දක්වා කලුතර දිස්ත්‍රික්කය තුළ බලපත්‍ර නිකුත් කර අලුතින් විවෘත කරන ලද මත්පැන් අලෙවිසැල්, විදේශීය මත්පැන් අලෙවිසැල්, අවන්හල් සහ හෝටල් සංඛ්‍යාව කොපමණද;

(ii) මැතිවරණ කොට්ඨාස මට්ටමින් ඒවායේ නම් සහ 2004 සිට 2007 දක්වා සෑම වර්ෂයකම අවසානයේදී සහ මේ දක්වා මෙම නව මත්පැන් අලෙවිසැල්වලින් උපයන ලද ආදායම කවරේද;

(iii) 1998 සිට 2003 දක්වා සෑම වර්ෂයකම දෙසැම්බර් 31 වැනි දිනට ඉහත (i) ට අදාළ තොරතුරු සහ කළුතර දිස්ත්‍රික්කය සඳහා මුලු ආදායම කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0881/'08

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) ගම්පහ දිස්ත්‍රික්කය තුළ ඇති මැතිවරණ කොට්ඨාස සංඛ්‍යාව එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2004 අප්‍රේල් 01 වැනි දින සිට මේ දක්වා ගම්පහ දිස්ත්‍රික්කය තුළ බලපත්‍ර නිකුත් කර අලුතින් විවෘත කරන ලද මත්පැන් අලෙවිසැල්, විදේශීය මත්පැන් අලෙවිසැල්, අවන්හල් සහ හෝටල් සංඛ්‍යාව කොපමණද;

(ii) මැතිවරණ කොට්ඨාස මට්ටමින් ඒවායේ නම් සහ 2004 සිට 2007 දක්වා සෑම වර්ෂයකම අවසානයේදී සහ මේ දක්වා මෙම නව මත්පැන් අලෙවිසැල්වලින් උපයන ලද ආදායම කවරේද;

(iii) 1998 සිට 2003 දක්වා සෑම වර්ෂයකම දෙසැම්බර් 31 වැනි දිනට ඉහත (i) ට අදාළ තොරතුරු සහ ගම්පහ දිස්ත්‍රික්කය සඳහා මුලු ආදායම කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0882/'08

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) කොළඹ දිස්ත්‍රික්කය තුළ ඇති මැතිවරණ කොට්ඨාස සංඛ්‍යාව එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2004 අප්‍රේල් 01 වැනි දින සිට මේ දක්වා කොළඹ දිස්ත්‍රික්කය තුළ බලපත්‍ර නිකුත් කර අලුතින් විවෘත කරන ලද මත්පැන් අලෙවිසැල්, විදේශීය මත්පැන් අලෙවිසැල්, අවන්හල් සහ හෝටල් සංඛ්‍යාව කොපමණද;

(ii) මැතිවරණ කොට්ඨාස මට්ටමින් ඒවායේ නම් සහ 2004 සිට 2007 දක්වා සෑම වර්ෂයකම අවසානයේදී සහ මේ දක්වා මෙම නව මත්පැන් අලෙවිසැල්වලින් උපයන ලද ආදායම කවරේද;

(iii) 1998 සිට 2003 දක්වා සෑම වර්ෂයකම දෙසැම්බර් 31 වැනි දිනට ඉහත (i) ට අදාළ තොරතුරු සහ කොළඹ දිස්ත්‍රික්කය සඳහා මුලු ආදායම කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?